ශ්‍රී ලංකා කජු සංස්ථාව

இலங்கை மரமுந்திரிகை கூட்டுத்தாபனம்

SRI LANKA CASHEW CORPORATION



වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT

2020

සභාපතිනියගේ පණිවිඩය

දේශීය වැවිලි භෝග ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා මහඟු අත්වැලක් සපයමින් දේශීය කජු වගාව නහා සිටුවීමට අගය එකතු කළ කජු නිෂ්පාදන හඳුන්වාදෙමින්, කජු වගා ව්‍යාප්ති කටයුතු සිදුකරමින්, කජු පර්යේෂණ හා සංවර්ධන කටයුතු දිරිගන්වමින්, සිය 50 වන වර්ෂ පූර්ණයට ළංවෙමින් සිටින ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2020 වර්ෂයේ සංවර්ධන වැඩසටහන් පෙළ පිළිබඳව මේ මොහොතේ ඒ වෙනුවෙන් පණිවුඩයක් එක් කිරීමට ලැබීම පිළිබඳව සතුටුවෙමි.

ඊසානදිග බ්‍රසීලයේ සම්භවයක් ඇති කජු ශාකය 16 වන ශතවර්ෂයේදී ඉන්දියාවේ ගෝවා ප්‍රාන්තය හරහා පෘතුගීසීන් විසින් ශ්‍රී ලංකාවට හඳුන්වා දී ඇත. ශ්‍රී ලංකාවේ වයඹදිග මුහුදුබඩ තීරයේ මුල් අවස්ථාවේ වගාකර ඇති අතර, පසුකාලීනව වියලි දේශගුණයක් ඇති කලාපවල වැවිය හැකි භෝගයක් ලෙස ප්‍රචලිත වී ඇත. වර්තමානයේදී මෙය වාණිජමය වශයෙන් වැදගත් ඉහළ කෘෂිකාර්මික ශක්‍යතාවයක් ඇති භෝගයක් ලෙස හඳුන්වා දිය හැකිය.

ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසුව කෘෂි ක්ෂේත්‍රයේ නියුක්ත වූවන් කජු වගාව කෙරෙහි අවධානය යොමු කළ අතර, විශේෂයෙන්ම 1973 දී ශ්‍රී ලංකා කජු සංස්ථාව ස්ථාපිත කිරීමෙන් පසුව කජු කර්මාන්තය වඩාත් ප්‍රචලිත වී ඇත. ශ්‍රී ලංකා කජු සංස්ථාව වෙත කජු කර්මාන්තයේ සංවර්ධනය ප්‍රධාන වශයෙන් පැවරී ඇත.

වර්තමානයේ කජු මද මඟින් සකස් කරන ලද ආහාර, විශේෂයෙන් සිංහල අළුත් අවුරුදු සහ නත්තල් සමයට රසකැවිලි, කේක්, ව්‍යාංජන සඳහා භාවිතා කරන අතර, කජු ලෙල්ලෙන් ලබාගන්නා දියරය (Cashew Nut Liquid Oil) ලැකර්, තීන්ත, ප්ලාස්ටික් නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍යයක් වශයෙන් භාවිතා කිරීමේ හැකියාවක් ඇත.

කජු මද සහ කජු නිෂ්පාදන සඳහා දේශීය මෙන්ම විදේශීය වෙළඳපොලෙහි විශාල ඉල්ලුමක් පවතී. ශ්‍රී ලංකාවේ කජු මදවල ඇති ඇත්දත් පැහැය, ප්‍රමාණයෙන් විශාල වීම, කජු මදය වටා ඇති සීනි සහිත ආවරණය නිසා ගෝලීය වෙළඳපොලෙහි විශාල ඉල්ලුමක් ඇති අතර, එම ඉල්ලුම සැපිරීම සඳහා ප්‍රමාණවත් කජු නිෂ්පාදනයක් සිදු නොවේ. වාර්ෂිකව ලෙලි කජු මෙට්‍රික් ටොන් 25,000 කට පමණ ඉල්ලුම පවතින අතර, නිෂ්පාදනය වනුයේ මෙ. ටො. 12,000 ක පමණ ප්‍රමාණයකි. මෙම තත්ත්වය අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා අහිතකර ලෙස බලපා ඇත.

2019 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ලෙලි කජු අස්වැන්න මෙ. ටො. 12,000 ක් වූ අතර, එය 2020 වර්ෂයේ මෙ. ටො. 12,250 කි. මෙය මෙම වසරේ ගෝලීයව පැවති කොවිඩ් 19 වසංගත රෝගී තත්ත්වය හමුවේ වුවද ලැබූ ජයග්‍රහණයකි. මෙය 2019 වර්ෂය හා සාපේක්ෂව 2% ක වර්ධනයකි. මෙම වර්ෂයේ අපනයන පරිමාව මෙ. ටො. 34.31 වූ අතර අපනයන වටිනාකම රු.මි. 81.13 කි.

2020 වර්ෂය තුලදී ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සියළුම සේවාවන් සැපයීම සහ වාණිජ කටයුතු ඉතා සතුටුදායක අන්දමින් පවත්වාගෙන යාමට හැකිවූ අතර, ඒ සඳහා සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත දක්වන ලද සහයෝගීතාවය පිළිබඳව මාගේ හෘදයාංගම ස්තුතිය හා ප්‍රණාමය ඔවුන් වෙත පුද කරමි.

විශේෂයෙන්ම සංස්ථාවේ සියළුම ක්‍රියාකාරකම් ඉහළ ඵලදායිතාවයකින් හා කාර්යක්ෂමතාවයකින් යුතුව පවත්වාගෙන යාම සඳහා සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ සහකාර සාමාන්‍යාධිකාරීවරුන් ඇතුළු සියළු කාර්ය මණ්ඩලය දැඩි කැපවීමකින් යුතුව කටයුතු කළ අතර, ඔවුන්ගේ සේවය ද අගය කරමි.

කුඩා පරිමාණයේ පිරිසැකසුම්කරුවන්, කජු නිෂ්පාදන අපනයනකරුවන්, කුඩා කජු ඉඩම්හිමියන්, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු සියළුම පාර්ශවකරුවන් මා වෙත දක්වන ලද සහයෝගය සහ කැපවීම මත මෙම සාර්ථකත්වය ළඟාකර ගැනීමට හැකිවූ අතර, එය ද අගය කරමි.

වැවිලි අමාත්‍ය **ගරු රමේෂ් පතිරණ මැතිතුමන්** සහ උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය **ගරු ජානක වක්කුඹුර මැතිතුමන්** සහ එම අමාත්‍යාංශයන්හි ලේකම්තුමන්ලා ඇතුළු අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය විසින් අප වෙත ලබාදුන් මග පෙන්වීම වෙනුවෙන් ද ස්තුතිවන්ත වෙමි.



නීතීඥ සාරංගා රත්නායක
සභාපතිනි
ශ්‍රී ලංකා කජු සංස්ථාව

පටුන පිටුව

01.	ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය	1-3
02.	ශ්‍රී ලංකා කපු සංස්ථාවේ ආයතනික ව්‍යුහය	3-15
03.	සංස්ථාවේ සංවර්ධන කාර්යන්	16-22
04.	පරිපාලන කටයුතු	22-24
05.	අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව	24-26
06.	විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව	27-29
07.	2020 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාව	30-33
08.	කාර්යසාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග	34-39
09.	කාර්යසාධනය පිළිබඳ වසර 05 ක සාරාංශය	40-42
10.	විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන	43-55
11.	විගණකාධිපති වාර්තාව	56-63
12.	විගණන වාර්තාවේ සඳහන් අඩුපාඩු නිවැරදි කරගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග	64-72
13.	වසර 05 ක ගිණුම් සාරාංශ	73

1. ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1.1.1 ශ්‍රී ලංකා කජු සංස්ථාව ස්ථාපනය

ශ්‍රී ලංකා කජු සංස්ථාව 1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1973 මැයි මස 25 වන දින අංක 60/7 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව පිහිටුවන ලදී. සංස්ථාව ආරම්භයේ සිට රාජ්‍ය ව්‍යාපාරයක් වශයෙන් ක්‍රියාත්මක වන අතර, කජු කර්මාන්තය සඳහා සියළුම සේවාවන් සැපයීම සිදු කරන අතරතුර වාණිජ කටයුතුද ලාභදායි මට්ටමකින් සිදුකරයි.

1.1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, ඉලක්ක හා අරමුණු

1.1.2.1 දැක්ම

ඉතාමත් උසස් තත්ත්වයේ කජු නිෂ්පාදනය කිරීම තුළින් ශ්‍රී ලංකාව ලෝකයේ කජු අපනයනය කරන ප්‍රමුඛතම රටක් බවට පත් කිරීම.

1.1.2.2 මෙහෙවර

කජු වගාව, නිෂ්පාදනය, පිරිසැකසුම් තාක්ෂණය, අගය එකතු කිරීම, පර්යේෂණ හා අලෙවි ප්‍රවර්ධන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ගොවීන් සහ අදාළ පාර්ශවයන් වෙත ඍත්තීයමය මහ පෙන්වීම ලබාදීම තුළින් දිගුකාලීන වූ වාණිජමය ශක්‍යතාවයක් ළඟාකර ගැනීමට හැකිවන පරිදි කජු කර්මාන්තය නඟා සිටුවීම.

1.1.2.3 ඉලක්ක හා අරමුණු

ගෝලීය ව පිළිගත් වෙළඳ නාමයක් සහ ඉහළ අපනයන ධාරිතාවයක් සඳහා ශ්‍රී ලංකාවේ කජු නිෂ්පාදනයේ ව්‍යාප්තිය, පිරිසැකසුම්කරණය, අලෙවිකරණය හා සහනිකකරණයේ ඵලදායිතාවය ඉහළ නැංවීම.

- වගාව ව්‍යාප්ත කිරීම මගින් අස්වැන්න ඉහළ නැංවීම
- කජු පිරිසැකසුම් කර්මාන්තයේ හා වතුයායන් වල ඵලදායිතාවය ඉහළ නැංවීම.
- ශ්‍රී ලංකාවේ කජු සඳහා ගෝලීයව පිළිගත් වෙළඳ නාමයක් ඇති කිරීම.
- අගය එකතු කිරීම හා නව නිෂ්පාදන සංවර්ධනය
- කජු අපනයනය දිරි ගැන්වීම.
- ශ්‍රී ලංකාව කජු නිෂ්පාදනයේ ප්‍රමුඛයා බවට පත්කිරීම.
- ලාභ ඉපැයීම මගින් ස්වයංපෝෂිත රාජ්‍ය සංස්ථාවක් බවට පත්කිරීම.

1.1.2.4 **රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ පළමුවන උපලේඛනය අනුව කපු සංස්ථාවේ කාර්යන්**

(අ) කපු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කපු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම සම්බන්ධ සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීමට උපදෙස් දීම.

(ආ) කපු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කපු නිෂ්පාදනය, පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම පිළිබඳ කටයුතු සිදු කිරීම.

(ඇ) කපු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කපු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම දියුණු කිරීමේ පරමාර්ථයෙන් විමර්ශන හා පර්යේෂණ කටයුතු සිදුකිරීම.

(ඈ) කපු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කපු නිෂ්පාදනය, පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම පිළිබඳ තාක්ෂණික, අලෙවි හා වෙනත් තොරතුරු රැස් කිරීම, පිළියෙල කිරීම, ප්‍රසිද්ධ කිරීම, බෙදා හැරීම සහ ඒ කටයුතු වලදී අන් අය සමඟ එක්ව ක්‍රියා කිරීම.

(ඉ) කපු සහ කපු නිෂ්පාදන පිරිසැකසුම් කිරීම සඳහා පිහිටුවනු ලබන කර්මාන්තශාලා පිහිටුවිය යුතු ස්ථාන, ඒවායේ ප්‍රමාණය හා තාක්ෂණික ප්‍රමිති නිශ්චය කිරීම සහ අළුත් කර්මාන්ත ශාලා පිහිටුවීමටත් අවශ්‍ය අවස්ථා වලදී එවකට පවතින කර්මාන්ත ශාලා ක්‍රියා කරවීම.

(ඊ) කපු සහ කපු නිෂ්පාදන මිලට ගැනීම, බෙදා හැරීම, විකිණීම සහ අපනයනය කිරීම.

(උ) කපු වගා කිරීම, පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම, කපු නිෂ්පාදනය, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම පිළිබඳ වැඩ කරගෙන යාම සඳහා අවශ්‍ය තැනැත්තන් පුහුණු කිරීම පිණිස පහසුකම් සැපයීම.

(ඌ) කපු වගාවන්, පිරිසැකසුම් කිරීමේ පහසුකම් සහ අලෙවි කිරීම දියුණු කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය මූලික සංවිධානය පිහිටුවීම සහ එම සංවිධාන පිහිටුවීමට ආධාර දීම.

(එ) කපු නිෂ්පාදන ප්‍රචාරය කිරීම හා විකිණීම සඳහා අවශ්‍යයැයි සලකනු ලබන පියවර ගැනීම, ලෝක වෙළඳපොළ තුල ඒ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම

ප්‍රවර්ධනය කිරීම සහ ඒ කාර්ය සඳහා හෝ ඊට සම්බන්ධ අනුෂාංගික කාර්යන් සඳහා ප්‍රචාරක කටයුතුවලට මුදල් යෙදවීම, ඒ කටයුතු අනුපාලනය කිරීම සහ ඒ කටයුතු වලට ආධාර දීම ආරම්භකොට ඊට අනුග්‍රහය දැක්වීම.

2. ශ්‍රී ලංකා කඵු සංස්ථාවේ ආයතනික ව්‍යුහය

2.1 අධ්‍යක්ෂ මණ්ඩලය

අනු අංකය	නම	තනතුර
01.	ආර්.ඒ එස්.කේ. සාරංගා රත්නායක මහත්මිය	සභාපතිනිය
02.	අශෝකා ලංකාතිලක මහත්මිය	නියෝජ්‍ය සභාපතිනිය
03.	එස්.කේ. කරුණාතුංග මහත්මිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (මහා භාණ්ඩාගාර නියෝජිත)
04.	සී.සී. මුහන්දිරම්ගේ මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විෂය භාර අමාත්‍යාංශයේ නියෝජිත)
05.	උපාලි වඩුආරච්චි මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
06.	චාමර සුබසිංහ මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
07.	අයි.ඩබ්.ඒ. සමන් කුමාර මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
08.	ඩී. මැදගෙදර මහතා	සාමාන්‍යාධිකාරී, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2.1 වගුව : 2020.01.01 දින සිට 2020.12.31 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි සාමාජිකයන්

2.2 **ශ්‍රී ලංකා කඵු සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටුව**

අනු අංකය	නම	තනතුර
01.	එස්.කේ. කරුණාතුංග මහත්මිය	කමිටු සභාපතිනී, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික මහා භාණ්ඩාගාර නියෝජිත (2020.01.01 සිට 2020.06.25 දක්වා)
02.	සී.සී. මුහන්දිරම්ගේ මහතා	කමිටු සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විෂයභාර අමාත්‍යාංශයේ නියෝජිත) (2020.06.26 සිට 2020.12.31 දක්වා)
03.	චාමර සුබසිංහ මහතා	කමිටු සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
04.	මේජර්.ඩී. මැදගෙදර මහතා	සාමාන්‍යාධිකාරී, කමිටු ලේකම්
05.	වී.යූ. ලියනගේ මහතා	සහකාර සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන
06.	ජී.එල්. රූබසිංහ මහතා	කමිටු නිරීක්ෂක, විගණන අධිකාරී (ජාතික විගණන කාර්යාලය)

2.2 වගුව : 2020 විගණන හා කළමනාකරණ කමිටුව

2.3 ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ඉහළ කළමනාකරණය

i). මේජර් ඩී. මැදගෙදර මහතා - සාමාන්‍යාධිකාරී

ii). පී.බී. කොඩිකාර මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

2.4 ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මධ්‍යම කළමනාකරණ කාර්ය මණ්ඩලය

i). එම්.ටී.එස්.කේ. පීරිස් මහතා - සහකාර සාමාන්‍යාධිකාරී - මුදල්

ii). ජී.බී.බී. සුරේන්ද්‍ර මහතා - සහකාර සාමාන්‍යාධිකාරී - ව්‍යාප්ති හා පර්යේෂණ

iii). වී.යු. ලියනගේ මහතා - අභ්‍යන්තර විගණන

iv). ආර්.එම්.පී. ජයතිස්ස මහතා - සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවි හා පිරිසැකසුම්

v). පී.එම්.ඒ.පී.කේ. විජේතුංග මහතා - සහකාර සාමාන්‍යාධිකාරී - වැවිලි

2.5 ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ආයතනික ව්‍යුහය

ශ්‍රී ලංකා කජු සංස්ථාව සතුව අංශ 07 ක් පවතින අතර, එම එක් එක් අංශයන් සහ එම එක් එක් අංශයන්ගේ කාර්ය භාරය පහත පරිදි වේ.

01. ව්‍යාප්ති සහ පර්යේෂණ අංශය
02. පාලන අංශය
03. මූල්‍ය අංශය
04. අභ්‍යන්තර විගණන අංශය
05. වැවිලි අංශය
06. අලෙවි සහ පිරිසැකසුම් අංශය
07. ප්‍රතිපත්ති සහ සැලසුම් අංශය

2.5.1 ව්‍යාප්ති සහ පර්යේෂණ අංශය

ව්‍යාප්ති අංශය සහ පර්යේෂණ අංශය, එක් සහකාර සාමාන්‍යාධිකාරීවරයකු යටතේ පාලනය වන අතර, එම අංශයන්ගේ කාර්ය භාරය පහත සඳහන් පරිදි වේ.

2.5.1.1 **ව්‍යාප්ති අංශය**

- කෘෂි වගාව ව්‍යාප්ත කිරීම සහ වගාවේ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ගොවීන් හට ආධාර කිරීම.
- ගොවීන්ගේ ගැටළු සහ බාධාවන් හඳුනාගෙන ඒ සඳහා විසඳුම් ලබාදීම.
- ස්වභාවික පරිසරය සංරක්ෂණය කිරීම සහ සහජීවනය ඉහළ නැවීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම මගින් ඵලදායීතාවය ඉහළ නැංවීම.
- කෘෂි වගාවේ සංවර්ධනය සඳහා රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණය කිරීම.
- කෘෂි මද පිරිසැකසුම් කිරීම ඉහළ නැංවීම හා කෘෂි වගාකරුවන් සහ කෘෂි පිරිසැකසුම්කරුවන් දැනුවත් කිරීම.

2.5.1.2 **පර්යේෂණ අංශය**

- වැඩි ඵලදාවක් සහිත, විවිධ දේශගුණික වෙනස්වීම් සඳහා ප්‍රතිරෝධිතාවයක් දක්වන, අවම රසායනික පොහොර සහ කෘමිනාශක භාවිතයක් සහිත නව කෘෂි ප්‍රභේදයන් හඳුන්වාදීම.
- උසස් තාක්ෂණික ක්‍රමවේද භාවිතයෙන් පරිසර සංරක්ෂණයද සහිතව වැඩි ඵලදායීතාවයක් ලබා ගැනීම පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම.
- පාරිභෝගිකයන්ගේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි ඵලදායීතාවය ඉහළ නැංවීම, අගය එකතු කිරීම, පසු අස්වනු තාක්ෂණය සහ ඇසුරුම්කරණය පිළිබඳ සැලකිලිමත් වීම.

2.5.2 **පාලන අංශය**

- ගොවීන්, පිරිසැකසුම්කරුවන්, අලෙවිකරුවන් සහ අවදානම් දරන්නන් සඳහා සේවාවන් සපයමින් සංස්ථාවේ කාර්යන්ගේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය ඉහළ නැංවීම මගින් ලාභදායීත්වය ඉහළ නැංවීම.
- සංස්ථා කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය සිදුකර කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.
- පරිපාලන රෙගුලාසි සම්පාදනය කිරීම.

2.5.3 **මූල්‍ය අංශය**

- නිවැරදි මූල්‍ය කළමනාකරණය මගින් සංස්ථාවේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය ඉහළ නැංවීම.

- අදාළ මුල්‍ය නීති සහ රෙගුලාසිවලට අනුකූලව ගෙවීම් සිදුකිරීම.
- විවිධ අංශයන්ගේ සහ ව්‍යාපෘතින්ගේ ආදායම්, වියදම්, ලාභ සහ අලාභ තත්ත්වයන් සඳහන් කරමින් මාසික වාර්තා සකස් කිරීම.
- සෑම වර්ෂයක් අවසානයේදීම වාණිජ සහ සේවා අංශයන්ගේ ලාභදායිත්වය සඳහන් කරමින් අවසාන ගිණුම් සකස්කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.

2.5.4 අභ්‍යන්තර විගණන අංශය

- ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මුල්‍ය සහ මුල්‍ය නොවන ක්‍රියාකාරකම් සඳහා ස්වාධීන තහවුරුකිරීම් සහ අභ්‍යන්තර පාලනයන් මත පදනම්ව සාධාරණත්වය සහ ප්‍රමාණවත් භාවය ස්ථාපිත කිරීම සඳහා අභ්‍යන්තර පරීක්ෂා සිදුකිරීම මගින් වංචා, දූෂණ සහ මගහැරීම් අනාවරණය කරගැනීම.
- ක්‍රමවත් උපාය මාර්ගයන් සහ ක්‍රමික ක්‍රමවේදයන් භාවිතයෙන් සහ සම්පත් සඵලදායි, කාර්යක්ෂම ආර්ථික ක්‍රම භාවිතා කරමින් මනා පාලනයකින් සහ අරමුණුගතව ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මෙහෙයුම් කටයුතු සිදුකිරීම.
- ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රගතිය අරමුණු කිරීම ආරම්භ කිරීමට අදාළ ව්‍යාපෘතින් සහ වැඩසටහන් පිළිබඳ දිර්ඝකාලීන තහවුරු කිරීම් සිදු කිරීම මගින් ප්‍රගතිය තහවුරු කිරීම.

2.5.5 වැවිලි අංශය

- සංස්ථාව සතු වතුයායන් සහ වාණිජ පැළ තවාන් ලාභදායීව පවත්වා ගෙන යාම.
- ස්වභාවික පරිසරය සංරක්ෂණය වන පරිදි වගා කටයුතු සිදුකිරීම.
- වතුයායන් සහ පැළ තවාන් ආශ්‍රිත ගම්බද ප්‍රදේශයන්හි ජනතාව සමඟ සුහදව කටයුතු කරමින් නිෂ්පාදනය සහ ඵලදායීතාවය ඉහළ නැංවීම.
- කජු වගාව ආදර්ශ වගාවක් ලෙස පවත්වා ගනිමින් ආයෝජකයන් සහ පිරිසැකසුම්කරුවන් ආකර්ශනය කරගැනීම.

2.5.6 අලෙවි සහ පිරිසැකසුම් අංශය

- නිෂ්පාදන පිරිවැය අවම කිරීමත්, ඵලදායීතාවය ඉහළ නැංවීමත් මගින් කජු පිරිසැකසුම් කර්මාන්තය ඉහළ නැංවීම.
- අන්තර්ජාතික ප්‍රමිති තත්ත්වයන්ට ගැලපෙන පරිදි අගය එකතුකළ කජු නිෂ්පාදනයන්ගේ ප්‍රමිතිය සහ රසය ඉහළ නැංවීම.

- කජු අලෙවි සහ පිරිසැකසුම් කර්මාන්තයේ උන්නතිය සඳහා රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ යහපත් සම්බන්ධතා පවත්වා ගනිමින් වාර්ෂිකව 10% ක් එම ක්ෂේත්‍රයේ සංවර්ධනය ඇති කිරීම.
- ලාභදායීත්වය ඉහළ නංවාගනිමින් සහ වෙළඳපොල තරඟකරුවන් සමඟ යහපත් සම්බන්ධතා පවත්වා ගනිමින්, අලෙවි අංශය කාර්යක්ෂමව සහ ඵලදායීතාවයෙන් යුක්තව පවත්වා ගෙන යාම.
- සේවකයන්ගේ දැනුම යාවත්කාලීන කිරීමත්, කුසලතා සංවර්ධනය කිරීම මගින් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සහ බලගැන්වීම.

2.5.7 ප්‍රතිපත්ති හා සැලසුම් අංශය

- සංයුක්ත සැලැස්ම හා ක්‍රියාත්මක සැලැස්ම වාර්ෂිකව සම්පාදනය කිරීම.
- සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාත්මක සැලැස්මට අදාළ අරමුණු සහ ඉලක්ක සත්‍ය ක්‍රියාකාරකම් සමඟ සංසන්දනය කර ඇගයීම් කටයුතු සිදුකිරීම, ඉහළ කළමණාකාරිත්වය, අධ්‍යක්ෂ මණ්ඩලය අනෙකුත් පාර්ශවයන් වෙත දැනුම් දීම සහ ඉලක්ක සපුරාගැනීමේ බාධක සඳහා විසඳුම් සොයා ගැනීම, සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම, කාර්යසාධනය සහ ගැටළු වාර්තා කිරීමත්ය.
- කජු ගොවීන් සහ පිරිසැකසුම්කරුවන්ගේ ක්‍රියාකාරකම් සහ සංස්ථාවේ සියළුම වාණිජ කාර්යන් පිළිබඳව දත්ත ගබඩාවක් පවත්වා ගෙන යාම.
- ඉලක්ක සපුරාගැනීමේ බාධාවන් හඳුනාගැනීම, එයට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, දැක්ම, මෙහෙවර, අරමුණු සහ ඉලක්ක ජයගැනීම් සඳහා සැලසුම් අවම පිරිවැයකින් යුක්තව සම්පාදනය කිරීම.
- කජු සංස්ථාව ලබාගන්නා ජයග්‍රහණ සහ කීර්තිනාමය ඉහළ නැංවීම, කජු වගා කිරීමේ ප්‍රතිලාභයන් මහජනතාව වෙත දැනුම්දීම සඳහා ප්‍රචාරණ කටයුතු සිදුකිරීම.

2.6 ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල

2.6.1 ප්‍රධාන කාර්යාලය

ශ්‍රී ලංකා කජු සංස්ථාව
අංක 1334, පරණ කෝට්ටේ පාර, රාජගිරිය

දුරකථන :

සභාපති	-	0112 - 871005
නියෝජ්‍ය සභාපති	-	0112 - 869844
සාමාන්‍යාධිකාරී	-	0112 - 876134
ෆැක්ස්	-	0112 - 867843
ඊ මේල්	-	cashewco@sltnet.lk
වෙබ් අඩවිය	-	www.cashew.lk

2.6.2 ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් ප්‍රාදේශීය කාර්යාල, වතුයායන්, රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන මධ්‍යස්ථාන හා පිරිසැකසුම් ඒකක

2.6.2.1 ප්‍රාදේශීය කාර්යාල

අනු අංක	නම හා තනතුර	ආවරණය වන දිස්ත්‍රික්ක	ලිපිනය	දුරකථන අංකය
01.	එන්.ඩී. වරුසවිතාරණ ප්‍රාදේශීය කළමනාකරු	අනුරාධපුරය	ශ්‍රී ලංකා කජු සංස්ථාව කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති ගොඩනැගිල්ල, ගොඩගේ මාවත, අනුරාධපුරය.	025-2227071 071-8046790
02.	බුද්ධික සඳරුවන් සහකාර ප්‍රාදේශීය කළමනාකරු	බදුල්ල මහනුවර	ශ්‍රී ලංකා කජු සංස්ථාව සී.ටී.සී හන්දිය, අළුත්තරම, මහියංගණය.	055-3555257 077-3410225
03.	එල්.ඩී. පතිරණගේ සහකාර ප්‍රාදේශීය කළමනාකරු	හම්බන්තොට රත්නපුර	ශ්‍රී ලංකා කජු සංස්ථාව, මධ්‍යම පැළ තවාන, දේවාල පන්සල පාර, කිරලවැල්කොටුව, ඇඹිලිපිටිය.	077-6263358
04.	එල්. සංජීවන් සහකාර ප්‍රාදේශීය කළමනාකරු	කිලිනොච්චිය මුලතිව් යාපනය වවුනියාව මන්නාරම	ශ්‍රී ලංකා කජු සංස්ථාව, පරණ කච්චේරි ගොඩනැගිල්ල, කිළිනොච්චිය.	021-2283830 077-9850497
05.	බුද්ධික සඳරුවන් සහකාර ප්‍රාදේශීය කළමනාකරු	අම්පාර	ශ්‍රී ලංකා කජු සංස්ථාව, 40 වන සැතපුම් කණුව, මංගලගම, අම්පාර.	077-3410225
06.	කේ.ඒ.ඒ.එන්. අමරසිංහ සහකාර ප්‍රාදේශීය කළමනාකරු	මොණරාගල	හෝමාගම වත්ත, 22 වන සැතපුම් කණුව, නක්කල, මොණරාගල.	055-2252090 071-8159195
07.	කේ.බී.එස්.ජේ. කාරියවසම් සහකාර ප්‍රාදේශීය කළමනාකරු	හම්බන්තොට	ශ්‍රී ලංකා කජු සංස්ථාව සිල්වාස්, මල්පෙත්තාව, අම්බලන්තොට.	071-8576359

අනු අංක	නම හා තනතුර	ආවරණය වන දිස්ත්‍රික්ක	ලිපිනය	දුරකථන අංකය
08.	එච්.එම්.ඒ.එස්. ජයවර්ධන සහකාර ප්‍රාදේශීය කළමනාකරු	පුත්තලම	ශ්‍රී ලංකා කජු සංස්ථාව, ශාන්ත මරියාපාර, සේනකුදිරිප්පුව, පුත්තලම.	032-2265998 070-3324319
09.	එච්.ටී.ඩී. දයාරත්න සහකාර ප්‍රාදේශීය කළමනාකරු	මඩකළපුව පොළොන්නරුව	ශ්‍රී ලංකා කජු සංස්ථාව, මහජන පුස්තකාලය, වී.සී පාර, වදුරමුලෙයි.	077-6181734
10.	කේ.ඩී. මදුසංඛ ස්ථානභාර නිලධාරී	මාතලේ	ශ්‍රී ලංකා කජු සංස්ථාව, නාලන්ද බීජ උද්‍යානය, මඩවල උල්පත, මාතලේ.	071-0144631
11.	ආර්.එස්. නරේෂ් කුමාර් ස්ථානභාර නිලධාරී	ත්‍රිකුණාමලය	ශ්‍රී ලංකා කජු සංස්ථාව, නුවර පාර, තඹලගමුව, ත්‍රිකුණාමලය	077-1303648

2.6.2.1 වගුව ප්‍රාදේශීය කාර්යාල

2.6.2.2 ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් වතුයායන්

අනු අංකය	වතුයායේ නම	පිහිටි දිස්ත්‍රික්කය	මුළු අක්කර ප්‍රමාණය	වගාකර ඇති අක්කර ප්‍රමාණය
01.	කමන්දළුව වතුයාය	පුත්තලම	548	548
02.	ආච්චිගෙවත්ත වතුයාය	පුත්තලම	961	961
03.	හාඩි වතුයාය	මඩකළපුව	365	190
04.	කොණ්ඩච්චි වතුයාය	මන්නාරම	6,498	420
05.	මාන්කර්ණි වතුයාය	මඩකළපුව	1,075	130
06.	පුනරීන් වතුයාය	කිළිනොච්චිය	479	479
07.	වෙල්ලන්කුලම වතුයාය	කිළිනොච්චිය	500	200
08.	තිරියාය වතුයාය	ත්‍රිකුණාමලය	10	10
	එකතුව		**10,436**	**2,938**

2.6.2.2 වගුව: වතුයායන් සහ ඉඩම් අක්කර ප්‍රමාණය

2.6.2.3 ශ්‍රී ලංකා කපු සංස්ථාවට අයත් බීජ උද්‍යාන

අනු අංක	බීජ උද්‍යාන	පිහිටි දිස්ත්‍රික්කය	මුළු අක්කර ප්‍රමාණය	වගාකර ඇති අක්කර ප්‍රමාණය
01.	එළුවන්කුලම බීජ උද්‍යානය	පුත්තලම	651	220
02.	විලච්චිය බීජ උද්‍යානය	අනුරාධපුරය	25	25
03.	සුදුවතුර ආර බීජ උද්‍යානය	මොණරාගල	45	45
04.	මහඔය බීජ උද්‍යානය	අම්පාර	81	45
05.	නාලන්ද බීජ උද්‍යානය	මාතලේ	135	50
	එකතුව		**937**	**385**

2.6.2.3 වගුව: බීජ උද්‍යාන පිහිටි ඉඩම් අක්කර ප්‍රමාණය



2.6.2.3 ඡායාරූපය: නාලන්ද බීජ උද්‍යානය - මාතලේ දිස්ත්‍රික්කය

2.6.2.4 ශ්‍රී ලංකා කපු සංස්ථාවට අයත් පැළ තවාන්

අනු අංක	මධ්‍යම පැළ තවානේ නම	ආවරණය වන දිස්ත්‍රික්ක	(අක්කර)	පැළ නිෂ්පාදන ධාරිතාවය (පැළ ගණන)
01.	මිහින්තලේ පැළ තවාන	අනුරාධපුරය, වව්නියාව, කිලිනොච්චිය, මුලතිව්, මන්නාරම,	2.5	120,000
02.	දඹුල්ල පැළ තවාන	මාතලේ, පොළොන්නරුව	3.0	25,000
03.	කමන්දළුව පැළ තවාන	පුත්තලම, කුරුණෑගල	1.0	150,000
04.	හාඩි පැළ තවාන	මඩකළපුව/ ත්‍රිකුණාමලය	1.0	10,000
05.	කුඹුක්කන පැළ තවාන	මොණරාගල	3.0	50,000
06.	මහියංගණය පැළ තවාන	බදුල්ල/ මහනුවර	2.0	50,000
07.	චන්ද්‍රිකාවැව පැළ තවාන	හම්බන්තොට/ රත්නපුර	0.5	20,000
එකතුව			**13.0**	**425,000**

2.6.2.4 වගුව: පැළ තවාන් පිහිටි ඉඩම් අක්කර ප්‍රමාණ



2.6.2.4 ඡායාරූපය: කමන්දළුව බද්ධ කජු පැළ තවාන - පුත්තලම

2.6.2.5 ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් කජු පිරිසැකසුම් මධ්‍යස්ථාන

අනු අංක	කජු පිරිසැකසුම් මධ්‍යස්ථාන	දිස්ත්‍රික්කය
01.	නැඳගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානය	ගම්පහ
02.	පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානය	පුත්තලම

2.6.2.5 වගුව: ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් කජු පිරිසැකසුම් මධ්‍යස්ථාන





2.6.2.5 ඡායාරූප - නැඳගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානය

2.6.2.6 ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් කජු පර්යේෂණ ඒකක

අනු අංක	පර්යේෂණ ඒකක	දිස්ත්‍රික්කය
01.	කමන්දළුව පර්යේෂණ ඒකකය	පුත්තලම
02.	පුත්තලම පර්යේෂණ ඒකකය	පුත්තලම

2.6.2.6 වගුව: ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් කජු පර්යේෂණ ඒකක

2.6.2.7 ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රධාන ඒකාබද්ධ පර්යේෂණ සහයෝගීතාවය

වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා ඒකාබද්ධව පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.





2.6.2.7 ඡායාරූපය: නව ප්‍රභේද ගොවීන් වෙත හඳුන්වාදීම සහ ඒ සඳහා පර්යේෂණ මෙහෙය වූ පර්යේෂකයින් ඇගයීම

2.6.2.8 ශ්‍රී ලංකා කජු සංස්ථාවේ අලෙවි සැල්

අනු අංක	සංස්ථා කජු අලෙවි සැල්	දිස්ත්‍රික්කය
01.	අංක 1334, පරණ කෝට්ටේ පාර, රාජගිරිය	කොළඹ
02.	අංක 518, ගාලු පාර, කොළඹ 03	කොළඹ
03.	අඹේපුස්ස කජු අලෙවිසැල	කෑගල්ල

2.6.2.8 වගුව: ශ්‍රී ලංකා කජු සංස්ථාවේ අලෙවි සැල්



2.6.2.8 **ඡායාරූපය:** අඹේපුස්ස කජු අලෙවි සැල විවෘත කිරීමේ අවස්ථාව

2.6.2.9 වරලත් කජු අලෙවි සැල්

අනු අංක	සංස්ථා වරලත් කජු අලෙවි සැල්	දිස්ත්‍රික්කය
01.	රන්දිය ෆැට්ස් ඇන්ඩ් නට්ස්, පයාගල, මග්ගොන.	කළුතර
02.	ආනන්ද ෆූඩ් සිටි, අංක 272, අහුරුවාතොට පාර, හොරණ.	කළුතර
03.	පානදුර කෝප් සිටි, සී/ස පානදුර විවිධ සේවා සමුපකාර සමිතිය, ජනප්‍රිය මාවත, පානදුර.	කළුතර

අනු අංක	සංස්ථා වරලත් කපු අලෙවි සැල්	දිස්ත්‍රික්කය
04.	නිව් ඇමරිකන් චිකන් හට්, 16, ශ්‍රී සාරානන්ද මාවත, කළුතර.	කළුතර
05.	ඔන්රෝ ෆාමසි, නො. 25, නාගොඩ පාර, කටුකුරුන්ද.	කළුතර
06.	නිව් මෝනිස් බේකරි, ගාළු පාර, මග්ගොන.	කළුතර
07.	සාගර බේකර්ස්, අහුරුවාතොට පාර, හොරණ.	කළුතර
08.	රෝයි ග්‍රොසරි, මතුගම පාර, කටුකුරුන්ද හන්දිය, කළුතර.	කළුතර
09.	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, නාරාහේන්පිට.	කොළඹ
10.	ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාරය, අංක 21, ගාළු පාර, දෙහිවල.	කොළඹ
11.	Ranjanas 7 Stories, අංක 318, ගාළු පාර, කොලඹ 04.	කොළඹ
12.	තල් සංවර්ධන මණ්ඩලය, ගාළු පාර, බම්බලපිටිය.	කොළඹ
13.	උදම්සා කිරිහල, 978 D 3, පන්නිපිටිය පාර, පැලවත්ත.	කොළඹ
14.	Colombo Cricket Club, මේවිලන්ඩ් චන්ද්‍රවංකය, කොළඹ 07.	කොළඹ
15.	ලයන් ග්‍රොසරි, මාකුඹුර, පන්නිපිටිය පාර, කොට්ටාව.	කොළඹ
16.	තලගල ස්ටෝර්ස්, තලගල.	කොළඹ
17.	ජේ.එෆ්. ටුවර්ස් ඇන්ඩ් ට්‍රැවල්ස්, ජාවත්ත පාර, බම්බලපිටිය.	කොළඹ
18.	සසේන් මිල්ක් බාර්, රාජගිරිය.	කොළඹ
19.	පැනොරාමා චයිනීස් රෙස්ටුරන්ට්, කොට්ටාව.	කොළඹ
20.	මාස්ටර් ෂොපර්, කොළඹ 01.	කොළඹ
21.	රෝයල් බේකරි, වැල්ලවත්ත.	කොළඹ
22.	කපුවත්ත මහත්මිය, නාවල පාර, රාජගිරිය.	කොළඹ
23.	අග්‍රාමාත්‍ය කාර්යාලය, කොළඹ.	කොළඹ
24.	Vintage Teas, අංගොඩ.	කොළඹ
25.	Minral Juice Bar, Pannipitiya.	කොළඹ
26.	නවමිණී (පුද්ගලික) සමාගම.	කොළඹ
27.	ජාතික ත්‍රිපෝෂ ආයතනය.	ගම්පහ
28.	Namunukula Dairy Stores, වත්තල.	ගම්පහ
29.	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, වැලිසර.	ගම්පහ
30.	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, මැල්සිරිපුර.	කුරුණෑගල
31.	Martin Farm, හලාවත.	පුත්තලම
32.	බලන්ගොඩ ෆුඩ් ෂොප්.	රත්නපුර
33.	කැන්ඩි ලයින්ස්, පාර්ක් රෝඩ්, කෑගල්ල.	කෑගල්ල
34.	සියුම් ෆුඩ් ප්‍රඩක්ට්ස්, අංක 499, කෙලින් වීදිය, කෑගල්ල.	කෑගල්ල
35.	රංගන සුබසිංහ මහතා, උඩුගල.	කෑගල්ල
36.	SEPPCO Mini Mart, ප්‍රධාන පාර, මාවනැල්ල.	කෑගල්ල
37.	සීමාසහිත යටිනුවර ගහපලාත විවිධ සේවා සමුපකාර සමිතිය, පොල්ගහමුල හන්දිය, පේරාදෙණිය.	මහනුවර
38.	සීමාසහිත යටිනුවර මැදපළාත විවිධ සේවා සමුපකාර සමිතිය, ඇඹිල්මීගම, පිළිමතලාව.	මහනුවර
39.	සීමාසහිත මධ්‍යම පළාත් සමුපකාර සමිතිය, ඇහැලේපොල කුමාරිහාමි මාවත, බෝගම්බර, මහනුවර.	මහනුවර
40.	සීමාසහත පූජාපිටිය සමුපකාර සමිතිය, පූජාපිටිය.	මහනුවර
41.	සීමාසහිත හාරිස්පත්තුව උතුර විවිධ සේවා සමුපකාර සමිතිය, මාතලේ පාර, අලවතුගොඩ.	මහනුවර
42.	සීමාසහිත කුණ්ඩසාලේ විවිධ සේවා සමුපකාර සමිතිය, මැණික්හින්න.	මහනුවර
43.	සීමාසහිත මහනුවර විවිධ සේවා සමුපකාර සමිතිය, කෝප්සිටි අලෙවිහල, පල්ලෙකැලේ.	මහනුවර


අනු අංක	සංස්ථා වරලත් කජු අලෙවි සැල්	දිස්ත්‍රික්කය
44.	කෝප් සිටි, කුණ්ඩසාලේ.	මහනුවර
45.	සෙප්කෝ සුපර්, බෝගම්බර.	මහනුවර
46.	විවිධ සේවා සමුපකාර සමිතිය - මහනුවර.	මහනුවර
47.	Dr. Smoothy Cafe, මහනුවර.	මහනුවර
48.	මියුලා ෂොප්, මහනුවර.	මහනුවර
49.	අවන්හල, මහනුවර.	මහනුවර
50.	Royal Mall (Pvt) LTD.	මහනුවර
51.	Sunrice Super, කුණ්ඩසාලේ.	මහනුවර
52.	කඩුගන්නාව විවිධ සේවා සමුපාකාර සමිතිය.	මහනුවර
53.	Mahaweli Reach Hotel, මහනුවර.	මහනුවර
54.	Agri Fresh, පේරාදෙණිය.	මහනුවර
55.	Value Added Agri Sales, ගන්නෝරුව.	මහනුවර
56.	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, කරඳගොල්ල Farm Shop.	මහනුවර
57.	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, මහබෙරියතැන්න.	මහනුවර
58.	Agri Fresh, ගන්නෝරුව.	මහනුවර
59.	මහනුවර කෝප්සිටි, ජාතික රෝහල.	මහනුවර
60.	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, හාරගම.	මහනුවර
61.	සීමාසහිත මාතලේ විවිධ සේවා සමුපකාර සමිතිය, කෝප්සිටි අලෙවිහල, මාතලේ.	මාතලේ
62.	සීමාසහිත මාතලේ විවිධ සේවා සමුපකාර සමිතිය, කෝප්සිටි අලෙවිහල, ලග්ගල.	මාතලේ
63.	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, බෙලිගම.	මාතලේ
64.	සුනිලා ග්‍රොසරි, අංක 35, අළුත්පාර, අම්බලන්ගොඩ.	ගාල්ල
65.	P & J සිටි, ගාමිණී මාවත, ගාල්ල.	ගාල්ල
66.	ප්‍රෙෂ් ෆාම් ෂොප්, ගාළු පාර, හික්කඩුව.	ගාල්ල
67.	ගෝල්ඩන් මේඩ්, 144, ගාළු පාර, අහංගම.	ගාල්ල
68.	හරිස්චන්ද්‍ර මිල්ස්, ටැල්බට් වීදිය, ගාල්ල.	ගාල්ල
69.	ඉන්ද්‍රා වයින් ස්ටෝර්ස්, හික්කඩුව.	ගාල්ල
70.	රුහුණු රසාර, ලබුදුව.	ගාල්ල
71.	රුහුණු රසාර, මාතර.	මාතර
72.	රුහුණු රසාර, තෙලිජ්ජවිල.	මාතර
73.	සම්පත් ෆාමසි ඇන්ඩ් ගොසරි, 39E, මාතර පාර, අකුරැස්ස.	මාතර
74.	අබේගුණවර්ධන ස්ටෝර්ස්, දෙනියාය.	මාතර

2.6.2.9 වගුව: වරලත් කජු අලෙවි සැල්

2.6.2.10 ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සංචාරක බංගලා

සංචාරක බංගලා		දිස්ත්‍රික්කය
1. පුත්තලම සංචාරක බංගලාව	-	පුත්තලම
2. හාඩ් සංචාරක බංගලාව	-	මඩකළපුව


Sri Lanka Cashew Corporation
Organization Structure



3. සංස්ථාවේ සංවර්ධන කාර්යන්

ශ්‍රී ලංකා කපු සංස්ථාවේ සංවර්ධන කාර්යන් ඉටුකිරීම සඳහා සංස්ථාව ප්‍රධාන වැඩසටහන් 04ක් ක්‍රියාත්මක කරයි.

1. **ව්‍යාජ්කි සහනාධාර වැඩසටහන**
2. **වතු සංවර්ධනය, පුනරුත්ථාපනය හා ඵලදායීතාවය වර්ධනය කිරීම**
3. **අලෙවි සහ පිරිසැකසුම් කර්මාන්ත සංවර්ධනය**
4. **පර්යේෂණ සහ සංවර්ධනය**



3.1 රූප සටහන: 2020 ශ්‍රී ලංකාවේ කපු වගා සංයුතිය (අක්කර)

වෙනත් ව්‍යාපෘති

- දිවි නැගුම ආර්ථික වගා ඒකක
- දිළිඳු ජනතාවගේ ආර්ථිකය දියුණු කිරීමේ හා ප්‍රජාව නඟා සිටුවීමේ ව්‍යාපෘති
- ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන වැඩසටහන - මාතලේ දිස්ත්‍රික්කය
- උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධ ව්‍යාපෘතිය ජාතික ඒකාබද්ධ සහ ප්‍රතිසංධාන අමාත්‍යාංශය/මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය / ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය / උක්, බඩඉරිඟු, කපු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ව්‍යාපෘති

3.1 ව්‍යාප්ති සහනාධාර වැඩසටහන

3.1.1 ශ්‍රී ලංකාවේ කජු වගාවේ ව්‍යාප්තිය

2020 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත සමස්ත කජු වගා භූමි ප්‍රමාණය අක්කර 169,289කි. 2020 වර්ෂයේදී දිස්ත්‍රික්ක 19ක සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 125ක් ආවරණය වන පරිදි බද්ධ කජු අක්කර 1,936ක් හා බීජ කජු අක්කර 745ක් වගා කරන ලද අතර මෙම සහනාධාර යෝජනා ක්‍රමයේ ගෙවතු වගාව යටතේ අක්කර 819ක් සඳහා පැළ 18,703ක් ලබාදෙන ලදී. මෙම සහනාධාර වැඩසටහන යටතේ පවුල් 7,709ක් සඳහා ප්‍රතිලාභ ලබාදී ඇත. කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා මෙම වැඩසටහන ප්‍රමාද විය.

කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය - 2020

අනු අංකය	දිස්ත්‍රික්කය	ඉලක්ක සහනාධාර වගා වපසරිය		ඉලක්ක ගෙවතු වගා වපසරිය	
		බද්ධ කජු (අක්කර)	බීජ කජු (අක්කර)	බද්ධ කජු (අක්කර)	බීජ කජු (අක්කර)
01.	පුත්තලම	325	05	55	40
02.	කුරුණෑගල	200	10	40	-
03.	හම්බන්තොට	65	35	80	20
04.	අනුරාධපුරය	229	9	112	-
05.	අම්පාර	70	165	55	-
06.	බදුල්ල	85	-	30	-
07.	මහනුවර	-	-	10	-
08.	රත්නපුර	05	15	20	10
09.	මාතලේ	140	-	60	-
10.	පොළොන්නරුව	85	40	40	-
11.	මොණරාගල	225	110	25	-
12.	මඩකළපුව	93	86	52	39
13.	ත්‍රිකුණාමලය	14	45	31	-
14.	වවුනියාව	125	25	25	-
15.	මන්නාරම	50	70	-	-
16.	මුලතිව්	75	75	-	-
17.	කිළිනොච්චිය	117.5	48	10	04
18.	යාපනය	32.5	07	10	26
19.	කෑගල්ල	-	-	25	-
	එකතුව	**1,936**	**745**	**680**	**139**

3.1.1 වගුව: 2020 වර්ෂයේ සහනාධාර කජු වගා භූමි ප්‍රමාණය

3.1.2 කජු වගා සහනාධාර වැඩසටහන යටතේ ගොවීන්ට ප්‍රතිලාභ ලබාදීම

බද්ධ කජු වගාකිරීම සඳහා අක්කරයකට රු. 9,500/-ක මුදලක් සහ බීජ කජු වගාකිරීම සඳහා අක්කරයකට රු. 3,500/-ක් වශයෙන් මෙම සහනාධාර වැඩසටහන යටතේ ප්‍රතිපාදන වෙන්කර ඇත. එසේ වුවද, මෙම වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණයන් මෙම කාර්ය සඳහා කිසිසේත් ප්‍රමාණවත් නොවේ. වර්තමානයේදී සහනාධාර වැඩසටහන යටතේ තෝරාගත් ගොවීන්හට ගොවි පුහුණුව සහ තාක්ෂණය ලබාදීම ඇතුළු අනෙකුත් ව්‍යාප්ති සේවාවන් නොමිලයේ ලබාදෙන අතර, වගාභූමි ප්‍රමාණයට අවශ්‍ය බද්ධ කජු පැළ සහ බීජ කජු පැළ නොමිලයේ ලබාදීම සිදුකරනු ලබයි. මෙම කටයුතු සංස්ථාවේ ප්‍රාදේශීය කාර්යාල 11ක් හරහා කජු වගාකරනු ලබන දිස්ත්‍රික්ක 19ක් මගින් ක්‍රියාත්මක වේ.

3.2 වතු සංවර්ධනය, පුනරුත්ථාපනය හා ඵලදායීතාවය වර්ධනය කිරීම

3.2.1 කජු වගාවේ ඵලදායීතාවය ඉහළ නැංවීම

3.2.1.1 රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

සංස්ථාවේ කජු රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන මධ්‍යස්ථානවල ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතය යටතේ (GAP) උසස් නිෂ්පාදන තත්ත්වයන් පවත්වා ගනිමින් මව්බීජ 500,000ක් නිෂ්පාදනය කරන ලදී. බද්ධ පැළ හා බීජ පැළ නිෂ්පාදනය කිරීමේදී එම මව්බීජ හා මව්ගස් වලින් ලබාගත් රිකිළි 520,000ක ප්‍රමාණයක් භාවිත කරන ලදී.

3.2.1.2 තවාන් කළමනාකරණය

සංස්ථාවේ මධ්‍යම පැළ තවාන් වලින් ඉහළ ගුණාත්මයෙන් යුතු නව ප්‍රභේද වලින් සමන්විත බද්ධ පැළ 422,570ක් නිෂ්පදනය කර, සහනාධාර වැඩසටහන, සංස්ථා වතුයායන් සහ පෞද්ගලික වතු හිමියන් සඳහා නිකුත් කරන ලදී. සහනාධාර යෝජනා ක්‍රමයට අවශ්‍ය බීජ පැළ 54,500ක් නිෂ්පාදනය කර බෙදාහරින ලදී.

අනු අංකය	පැළ තවානේ නම	නිපදවන ලද බද්ධ පැළ	නිපදවන ලද බීජ පැළ
01.	කමන්දළුව	137,591	-
02.	දඹුල්ල	26,072	14,000
03.	මිහින්තලේ	155,676	19,300
04.	මහියංගණය	30,476	16,500
05.	කුඹුක්කන	31,297	2,200
06.	හාඩි	20,972	-
07.	වන්දිකා වැව	20,486	2,500
	එකතුව	422,570	54,500

3.2.1.2 වගුව: 2020 වර්ෂයේ කජු පැළ නිෂ්පාදනය

3.2.1.3 වතුයායන්වල නව වගාව

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ පුත්තලම, කමන්දළුව, හාඩි සහ මාන්කර්ණි යන වතුයායන්වල සංවර්ධන කටයුතු සිදු කළ අතර, එළුවන්කුලම I අදියර බීජ උද්‍යානයේ අක්කර 15ක නව වගාවක් සිදු කරන ලදී. කොණ්ඩච්චි වතුයාය ප්‍රතිස්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ රු.මි. 5.0ක ප්‍රතිපාදන මත කොණ්ඩච්චි වතුයායේ අක්කර 131ක පමණ කජු වගා කරන ලදී. මෙම වර්ෂයේදී වෙල්ලන්කුලම වතුයාය අත්පත් කරගන්නා ලද අතර, එහි අක්කර 200ක සංවර්ධන කටයුතු කරන ලදී.

එසේම අතුරු භෝග වගාව සඳහා පුත්තලම වතුයායේ අක්කර 180ක් වල් මර්දනය සිදුකර පෞද්ගලික අංශයේ ව්‍යවසායකයකුට ලබාදෙන ලදී. මීට අමතරව කොණ්ඩච්චි වතුයායේ පැළ 3,600ක්, සුදුවතුර ආර වතුයායේ පැළ 2,000ක් සහ මහඔය වතුයායේ පැළ 1,500 ක් ලෙස පාළු පැළ සිටුවීම සිදු කරන ලදී.

3.2.1.4 සංවර්ධන ව්‍යාපෘති සඳහා පැළ ලබාදීම

2020 වර්ෂයේදී **"අපනයන ආශ්‍රිත කජු පොකුරු ගම්මාන ව්‍යාපෘතිය"** උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය දායකත්වයෙන් බද්ධ කජු පැළ 100,000 ක් මුලතිව්, වවුනියාව, කිලිනොච්චිය, පුත්තලම, අනුරාධපුරය යන දිස්ත්‍රික්කයන්හි අක්කර 1,428 ක් වගා කිරීම සඳහා ප්‍රතිලාභීන් වෙත බෙදාදෙන ලදී.

3.2.1.5 ඵලදායීතාවය වැඩි දියුණු කිරීම

කජු වගාවේ රෝග හා පළිබෝධ මර්දනය හා ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතයෙන් (GAP) ඵලදායීතාවය ඉහළ නැංවීමේ අරමුණින් "හෙලෝපෙල්ටිස්" මකුණාගේ හානිය සහ කඳ හා මුල් විඳින පණු රෝග මර්දනය කිරීම සඳහා පළිබෝධ මර්දන වැඩසටහන් දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව, ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ අනුග්‍රහයෙන් ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතය හා කජු වගාවේ පළිබෝධ මර්දනය පිළිබඳ සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා පැවැත්වීමට නොහැකි වූ අතර පුහුණු වැඩසටහන් 02ක් පමණක් පැවැත්වීමට හැකිවිය.

3.3 අලෙවි සහ පිරිසැකසුම් කර්මාන්ත සංවර්ධනය

3.3.1 ලෙලි කපු මිලට ගැනීම

වෙළඳපොල තරහකාරී තත්ත්වයනට මුහුණදීම හා පිරිවැය අවම කිරීමේ පරමාර්ථයෙන් මෙම වර්ෂයේදී සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් ලෙලි කපු මෙ.ටො. 64ක් මිලදී ගන්නා ලදී. මේ නිසා තරහකාරී වෙළඳපොල මිල පරාසයක් ස්ථාපිත විය. මෙම වර්ෂයේ සංස්ථා වතුයායන්ගෙන් ලැබුණු මෙ.ටො. 149.46ක අස්වැන්නද සංස්ථා කර්මාන්තශාලාවල පිරිසැකසුම් කරන ලදී.

3.3.2 කපු පිරිසැකසුම් කර්මාන්තය ශක්තිමත් කිරීම

උසස් ප්‍රමිතියෙන් යුක්ත වූ කපු මද නිෂ්පාදන වෙළඳපොලට ඉදිරිපත් කිරීම මගින් ඉහළ මිලක් උපයාගැනීම පිණිස උසස් නිෂ්පාදන යාන්ත්‍රණයක් අත්‍යාවශ්‍ය වේ. මෙම වැඩසටහනට අනුකූලව කපු පිරිසැකසුම්කරුවන් සඳහා විජලන යන්ත්‍ර හා විදුලි බලයෙන් ක්‍රියාත්මක කරන කපු කැපීමේ යන්ත්‍ර ලබාදීම, ප්‍රශස්ත නිෂ්පාදන ක්‍රමවේද භාවිතයෙන් (GMP) හා අගය එකතු කිරීම හා ප්‍රමිති තත්ත්වයන් සම්බන්ධව පිරිසැකසුම්කරුවන් පුහුණු කිරීම, පිරිසැකසුම් සමිති සඳහා මූල්‍ය පහසුකම් ලබාගැනීම සඳහා සහායවීම හා වෙළඳපොල ප්‍රවර්ධනය සඳහා සහාය ලබාදීම සිදු කරන ලදි.

3.3.3 කපු පිරිසැකසුම් කිරීම හා අලෙවිකරණය

සංස්ථාවට අයත් කපු පිරිසැකසුම් මධ්‍යස්ථාන පුත්තලම හා නැදගමුව (ගම්පහ දිස්ත්‍රික්කය) පිහිටා ඇත. සංස්ථා වතුයායන්ගෙන් ලබාගන්නා ලද ලෙලිකපු පිරිසැකසුම් කර, අගය එකතු කරන ලද කපු මද කොල්ලුපිටිය හා රාජගිරිය සහ 2020 වර්ෂයේ ආරම්භ කරන ලද අඹේපුස්ස කපු අලෙවිසැල් 03ට අමතරව දිවයිනේ ව්‍යාප්තව පවතින වරලත් අලෙවි සැල් 74ක් උපයෝගී කරගෙන පාරිභෝගිකයන් වෙත අලෙවි කටයුතු කිරීම පවත්වා ගෙන යන ලදී. නව තාක්ෂණික ක්‍රම භාවිතය, අගය එකතු කිරීම හා උසස් කපු නිෂ්පාදන අලෙවි කිරීම මගින් රු.මි. 47.23ක මුදලක් උපයා ගැනීමට සංස්ථාව සමත්විය.

3.3.4 කපු නිෂ්පාදන අපනයනය හා විදේශ විනිමය ඉපැයීම

2020 වර්ෂයේදී උසස් තත්ත්වයේ අගය එකතු කරන ලද කපු මද මෙ.ටො. 34.31ක් ජාත්‍යන්තර වෙළඳපොළට ඉදිරිපත් කිරීම මගින් රු.මි. 81.13ක විදේශ විනිමය ඉපැයීමට ශ්‍රී ලංකාව සමත්විය. 2019 වර්ෂයේ අගය එකතුකරන ලද කපු මද මෙ.ටො. 47.40ක් අපනයනය කිරීමෙන් රු.මි. 93.57ක විදේශ විනිමයක් උපයා ගෙන ඇත. මේ අනුව, වර්ෂයේදී අපනයන ධාරිතාවය හා විදේශ විනිමය ඉපයීම 2019 වර්ෂයට වඩා අඩුවීමක් පෙන්නුම් කරන අතර, මේ සඳහා ගෝලීයව පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය බලපෑ අතර, දේශීය සංචාරක කර්මාන්තයේද සීඝ්‍ර පසුබැස්මත් සමඟ කපු මද සඳහා දේශීය ඉල්ලුම පහළ යාමත්, ඒ අනුව දේශීය පරිභෝජනය පහළයාමද සිදු වී ඇත.

3.3.5 කපු ආනයනය

3.3.5.1 දේශීය පරිභෝජනය සඳහා ආනයනය

දේශීය වශයෙන් නිෂ්පාදනය කරන කපු ප්‍රමාණවත් නොවීම නිසා විශේෂයෙන් ජනවාරි, පෙබරවාරි හා මාර්තු යන මාසවල කුඩා පරිමාණ කපු පිරිසැකසුම්කරුවන්ට අවශ්‍ය ලෙලිකපු දේශීය වෙළඳපොල තුළ හිඟතාවයක් ඇතිවිය. මේ සඳහා විසඳුමක් වශයෙන් කුඩා පරිමාණ කපු පිරිසැකසුම්කරුවන් සඳහා බදු සහන යටතේ ලෙලිකපු ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබාදෙන ලදී.

මෙම ආනයන බලපත්‍ර තාවකාලික පදනම මත දේශීය නිෂ්පාදන වෙළඳපොලෙහි හිඟ කාලයේදී පමණක් ලබාදීම සිදු කරයි. ශ්‍රී ලංකා රේගුවේ වාර්තාවලට අනුව, ලෙලිකපු මෙ.ටො. 549.2ක් හා කපු මද මෙ.ටො. 0.025ක් ආනයනය කර කුඩා පරිමාණ නිෂ්පාදකයන් විසින් පිරිසැකසුම්කරුවන් රාශියක් අතර බෙදාහරින ලදී. මේ අනුව, කපු පිරිසැකසුම් කර්මාන්තයේ නියැලෙන පවුල්වල ජීවනෝපාය ස්ථාවර කිරීම සඳහා සංස්ථාවට මැදිහත්වීමට අවස්ථාව ලැබුණි.

3.4 පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්

ශාක අභිජනනය, පොහොර භාවිතය, කජු වගාවේ රෝග හා පලිබෝධ මර්දනය, බද්ධ කිරීමේ විවිධ තාක්ෂණික ක්‍රම අත්හදා බැලීම, බද්ධ හා බීජ කජු වගාව, පැළ ඝනත්වය, පසු අස්වනු තාක්ෂණය, අස්වැන්න සහ අතුරුභෝග වගාව පිළිබඳ අඛණ්ඩ පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. මෙම වැඩසටහන් වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය සමඟ ඒකාබද්ධ ක්‍රියාත්මක කරන ලදී. පර්යේෂණ හා කළමනාකරණ කමිටුව මගින් මෙම වැඩසටහන්වල ප්‍රගතිය ඇගයීම සිදු කරන ලදී. මෙම පර්යේෂණවල ප්‍රතිඵල ව්‍යාප්ති සේවා ජාලය මගින් උපදේශන සේවා ලබාදීමේදී මෙන්ම ක්ෂේත්‍ර ආදර්ශන, පත්‍රිකා, වීඩියෝ සහ රූපවාහිනී වැඩසටහන් මගින් ගොවීන් වෙත ලබාදෙන ලදී. මීට අමතරව කජු වගාවේ අභිවෘද්ධිය සඳහා වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම සහ වැවිලි කළමනාකරණ පීඨය සමඟ ඒකාබද්ධව උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුත් නව කජු ප්‍රභේද 03ක් WUCC 02, WUCC 07, WUCC 16 ලෙස මෙම වර්ෂයේදී හඳුන්වා දෙන ලදී.
(WUCC – Wayamba University Cashew Corporation)

4. පරිපාලන කටයුතු

කුඩා කජු ඉඩම් හිමියන්, කජු පිරිසැකසුම් කර්මාන්තයේ නියැලෙන්නන් හා පාරිභෝගිකයන් වෙත ගුණාත්මක හා කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ අරමුණ ඇතිව විධිමත් කළමනාකරණ භාවිතයන් සිදුකිරීමට හැකියාව ලැබුණි. රාජ්‍ය ව්‍යවසායක් ලෙස සේවාවන් සපයන අතර, ලාභ ඉපැයීමද අරමුණුකර ඇති බැවින්, සංස්ථාවේ සියළුම පාර්ශවකරුවන්ගේ සහය මේ සඳහා ලබාගත හැකිවිය.

මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ සහකාර සාමාන්‍යාධිකාරීන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයේ සහායද නොමඳව ලැබුණි. රජයේ නව සංවර්ධන උපායමාර්ගවලට අනුකූලව ජනතාවගේ ආදායම් උත්පාදනය හා සංස්ථාවේ අරමුණු මුදුන්පත් කරගැනීම සඳහා ද මේ අනුව කටයුතු කළහැකි විය.

2020 වර්ෂයේ කාර්ය මණ්ඩලයේ කළමනාකරණ සහකාරවරුන් 50ක් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් පවත්වන ලදී. එම වර්ෂයේ පැවති කොවිඩ් 19 වසංගත රෝගී තත්ත්වය නිසා සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය.

4.1 2020.12.31 දිනට කාර්ය මණ්ඩල කළමනාකරණය

අනුමත කාර්ය මණ්ඩලය			2020.12.31 දිනට කාර්ය මණ්ඩලය
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ ශ්‍රේණිය	(HM)	2	02
මධ්‍යම කළමනාකරණ ශ්‍රේණිය	(MM)	7	05
කනිෂ්ඨ කළමනාකරණ ශ්‍රේණිය	(JM)	26	18
කළමනාකරණ සහකාර	(MA)	122	79
සුළු ශ්‍රේණිය	(PL)	67	63
එකතුව		**224**	**167**

මෙයට අමතරව සංස්ථාවේ පිරිසැකසුම් මධ්‍යස්ථාන, වතුයායන්, ශාක අභිජනන මධ්‍යස්ථාන හා මධ්‍යම පැළ තවාන්වල මාසික අවශ්‍යතා මත වෙක්‌රෝල් කම්කරුවන් 200ක් පමණ සේවයේ යොදවා ඇත.

4.2 2020 වර්ෂයේ ලබාගත් ජයග්‍රහණ

වර්ෂ 2018 දී හා 2019 දී වාර්තාගත වූ අලෙවි කාර්යන් මගින් ලාභ ලබන තත්ත්වය වර්ෂ 2020 දී අඛණ්ඩව පවත්වා ගැනීමට සමත්විය. මේ සඳහා සංස්ථාවේ වාණිජමය ක්‍රියාකාරකම් උපයෝගි කරගත් අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායි හා කාර්යක්ෂම මඟ පෙන්වීම සහ කාර්ය මණ්ඩලයේ කැපවීම මේ සඳහා හේතු සාධක විය.

පහත සඳහන් බාධක නිසා කාර්යසාධනය ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකියාව නොලැබුණි.

- 2020 වර්ෂයේ ගෝලීයව පැවති කොවිඩ් 19 වසංගත රෝගී තත්ත්වයේ බලපෑම.
- අයහපත් කාලගුණ තත්ත්වයන් මත එනම්, මල් හටහන්නා කාලසීමාව තුල අධික නියඟයකට ලක්වීම හේතුවෙන් මල් වියලීමකට ලක්වීම නිසා වතුයායන්වල අස්වැන්න අපේක්ෂිත මට්ටමට වඩා අඩුවීම.
- දේශීය ලෙලිකජු ඉල්ලුමට සරිලන සැපයුමක් වාර්තා නොවීම නිසා කජු ඉහළ මිල ගණන් නියම වීම.

- කම්කරු වියදම් හා ද්‍රව්‍ය වියදම් ඉහළ යාම.

- පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදානයන් සීමාකිරීම හේතුවෙන් නව කාර්යන් ආරම්භ කිරීමේදී මෙන්ම අත්‍යාවශ්‍ය සේවාවන් ඉටුකර ගැනීමේදී බාධා ඇති විය. මේ අනුව මෙම කාර්යන් අඛණ්ඩව සිදුකර ගැනීම සඳහා සංස්ථාව විසින් උපයාගත් අරමුදල් උපයෝගී කර ගැනීමටද සිදුවිය. මෙහි ප්‍රතිඵලයක් ලෙස වාණිජමය හා සංවර්ධන කාර්යන්හි ආයෝජනය සඳහා අරමුදල් හිඟතාවය ඇතිවිය.

5. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා කජු සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මේ සමඟ ඉදිරිපත් කරමි.

මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2003 ජුනි මස 02 වනදා නිකුත් කළ චක්‍රලේඛ අංක පී.ඊ.ඩී/12 ට අනුව ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන 2023 ජනවාරි 31 වන දින විගණකාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදී.

5.1 ආරම්භය

1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 2 වන වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ අංක 60/7 දරණ ගැසට් නිවේදනය මගින් 1973 මැයි 25 දින ශ්‍රී ලංකා රජයේ අනුමැතිය හා එවකට වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගේ නියෝගය මත රු.මි. 40ක මුලික ප්‍රාග්ධනයකින් යුක්තව ශ්‍රී ලංකා කජු සංස්ථාව පිහිටුවන ලදී.

5.2 ප්‍රතිඵල

ප්‍රවර්තන වසරෙහි මූල්‍ය ප්‍රතිඵල සහ ස්කන්ධය වෙනස්වීම පිළිබඳ දත්ත ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර ඇත.

5.3 ව්‍යාපාර සමාලෝචනය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ ශ්‍රී ලංකා කපු සංස්ථාවේ මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා ඇති අතර, ඒ පිළිබඳ ඇගයීමක් සභාපතිතුමාගේ වාර්තාවේ ඇතුලත් කර ඇත.

5.4 දේපල, පිරියත හා උපකරණ

මුල්‍ය ප්‍රකාශනයෙහි ප්‍රවර්තන වසරට අදාළව දේපල, පිරියත හා උපකරණවල සිදුවූ වෙනස්කම් සටහන් අංක 1 මගින් පැහැදිලි කර ඇත. මෙම සටහනෙහි පෙන්වන වටිනාකම් ඒවායේ වර්තමාන වෙළඳපොල අගය හා ප්‍රමාණාත්මක වෙනස්කම් නොපවතී.

5.5 සංචිත

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය තුල සංස්ථාවේ මුළු සංචිතවල සංයුතිය සඳහන්ව ඇත.

5.6 අධ්‍යක්ෂ මණ්ඩලය

(2020.01.01 දින සිට 2020.12.31 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි සාමාජිකයන්)

අනු අංකය	නම	තනතුර
01.	ආර්.ඒ. සාරංගා රත්නායක මහත්මිය	සභාපතිනිය
02.	අශෝකා ලංකාතිලක මහත්මිය	නියෝජ්‍ය සභාපතිනිය
03.	එස්.කේ. කරුණාතුංග මහත්මිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - මහා භාණ්ඩාගාර නියෝජිත
04.	සී.සී. මුහන්දිරම්ගේ මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - විෂය භාර අමාත්‍යාංශයේ නියෝජිත
05.	උපාලි වඩුආරච්චි මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
06.	වාමර සුහසිංහ මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
07.	අයි.ඩබ්.ඒ. සමන් කුමාර මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
08.	ඩී. මැදගෙදර මහතා	සාමාන්‍යාධිකාරී, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

5.7 **විගණන හා කළමනාකරණ කමිටුව**

රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශනයන්ට (Public Enterprises Guideline) අනුකූලව සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවා ඇත.

5.8 **ව්‍යවස්ථාපිත ගෙවීම්**

රජයට සහ සේවකයන්ට ගෙවිය යුතු සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් නිසියාකාරව ගෙවා ඇත.

5.9 **පාරිසරික ආරක්ෂාව**

පරිසරයට අහිතකර කිසිදු ක්‍රියාකාරකමකට සංස්ථාව මැදිහත් වී නොමැත.

5.10 **මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පසු සිදුවීම්**

ශේෂ පත්‍ර දිනට පසු ගිණුම් මගින් ගැලපීම් කිරීමට හෝ හෙළිදරව් කිරීම සඳහා කිසිදු සිදුවීමක් වාර්තා වී නොමැත.

5.11 **විගණකවරු**

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන රජයේ විගණකාධිපති විසින් විගණනය කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය මත,

D. medagedara

ඩී.මැදගෙදර

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

6. විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

අංක PED 31 දරණ චක්‍රලේඛයේ (2005.07.01 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය) උපදෙස් ප්‍රකාරව හා එම චක්‍රලේඛයට අදාළව වරින්වර සිදු කරන ලද සංශෝධනයන් මත ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව ශ්‍රී ලංකා කජු සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කරන ලද අතර, එය සාමාජිකයන් පස් දෙනෙකුගෙන් හා නිරීක්ෂකයෙකුගෙන් සමන්විත අතර, සමස්තය 06 දෙනෙකුගෙන් යුත් කමිටුවක් විය.

2020 වර්ෂය තුලදී අදාළ කමිටුවේ සභාපතිවරයා ලෙස මහා භාණ්ඩාගාරය නියෝජනය කරනු ලබන විධායක නොවන අධ්‍යක්ෂවරයා ද එම නියෝජනය නොමැති අවස්ථාවලදී විෂය භාර අමාත්‍යාංශ නියෝජනය කරනු ලබන විධායක නොවන අධ්‍යක්ෂවරයා ද කටයුතු කළ අතර, කමිටුවේ ලේකම්වරයා ලෙස මෙම සංස්ථාවේ සාමාන්‍යාධිකාරීවරයා ද කටයුතු කරන ලදී.

අදාළ චක්‍රලේඛයන්හි නියමයන්ට අනුව වර්ෂයක කාලසීමාවක් තුලදී අවම වශයෙන් රැස්වීම් වාර 04ක් වත් පැවැත්විය යුතු වුවද 2020 වර්ෂයේ මුල් භාගයේ සිට පැවතුනු කොවිඩ් 19 වසංගත රෝගි තත්ත්වය නිසා කාර්යාල කටයුතු දැඩිලෙස සීමාවීම් හේතුවෙන් 2020 වර්ෂය හා අදාළව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02ක් පමණක් පැවැත්වීමට හැකි වූ අතර, එම රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ හා නිරීක්ෂකයන්ගේ සහභාගීත්වය පහත පරිදි විය.

අනු අංකය	නම	විස්තරය	වාර ගණන
01	එස්.කේ. කරුණාතුංග මහත්මිය	කමිටු සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, මහා භාණ්ඩාගාර නියෝජිත (2020.01.01. දින සිට 2020.06.25 දින දක්වා)	1/2
02	සී.සී. මුහන්දිරම්ගේ මහතා	කමිටු සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික විෂය භාර අමාත්‍යාංශයේ නියෝජිත (2020.06.26 දින සිට 2020.12.31 දින දක්වා)	2/2
03	වාමර සුභසිංහ මහතා	කමිටු සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	2/2
04	මේජර් ඩී. මැදගෙදර මහතා	කමිටු ලේකම්, සාමාන්‍යාධිකාරී	2/2
05	වී.යු. ලියනගේ මහතා	කමිටු සාමාජික, සහකාර සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන	2/2
06	ජී.එල්. රූබසිංහ මහතා	කමිටු නිරීක්ෂණ, විගණන අධිකාරී, ජාතික විගණන කාර්යාලය	2/2


සමාලෝචිත වර්ෂය තුලදී පවත්වන ලද පළමු විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීමේදී ශ්‍රී ලංකා කජු සංස්ථාව සතු ඉඩම්වල නීතිමය අයිතිය නිරවුල් කරගැනීමේ ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා කරන ලද අතර, මෙතෙක් සංස්ථාවේ නීතිමය අයිතිය පවරාගෙන නොමැති වතුයායන් සහ බීජ උද්‍යාන ඉඩම් 14ක් සම්බන්ධයෙන් මෙහිදී දීර්ඝ වශයෙන් කරුණු සාකච්ඡා කරන ලදී. අදාළ ඉඩම්වල නීතිමය අයිතිය පවරාගැනීම සඳහා කළයුතු දීර්ඝ ක්‍රියාවලියේදී විෂය භාර අමාත්‍යාංශයේ සහාය සහ උපදෙස් ලබාගතයුතු ආකාරය සම්බන්ධයෙන් මෙහිදී කරුණු සාකච්ඡා කරන ලදී.

එසේම සංස්ථාවෙන් විශ්‍රාම ලබා පාරිතෝෂික දීමනා මුදල් ලබාගැනීමට පෙර මියගිය නිලධාරීයෙකුට එම දීමනා ගෙවීම සම්බන්ධයෙන් ඇති ගැටළු නිරාකරණය කරන ආකාරය කමිටුවේ සාකච්ඡාවට භාජනය වූ අතර, සංස්ථාවේ අලෙවි අංශයේ කටයුතුවල ප්‍රගතිය, වත්කම් අපහරණ කටයුතුවල ප්‍රගතිය, පර්යේෂණ අංශයේ කටයුතුවල ප්‍රගතිය සම්බන්ධයෙන්ද සමාලෝචනයක් කමිටුව මගින් සාකච්ඡා කරන ලදී. එමෙන්ම සමාලෝචිත කාලසීමාවට අදාළ සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය මගින් නිකුත්කර ඇති විගණන වාර්තා සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ කටයුතුවල ප්‍රගතිය ද, ජාතික විගණන කාර්යාලය මගින් මුදල් පනතේ විධිවිධාන වලට අනුව නිකුත්කර ඇති විගණන වාර්තාවලට, විගණන වාර්තාවල අන්තර්ගත විගණන ඡේද සම්බන්ධයෙන් සංස්ථා පාර්ශවයෙන් අදහස් දැක්වීම් සහ ගැනීමට යෝජිත පියවර සඳහන් කරමින් පිළියෙල කර ඇති වාර්තා පිළිබඳව කමිටුවේ අවධානය යොමුකරන ලදී.

2020 වර්ෂය සඳහා පවත්වන ලද දෙවන සහ අවසාන කළමනාකරණ කමිටු රැස්වීමේදී අදාළ වර්ෂයේ පළමු විගණන හා කළමනාකරණ කමිටු සාකච්ඡා අනුව ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් සමාලෝචනයක් කමිටුව විසින් සිදුකළ අතර, ඊට අතිරේකව 2021 වර්ෂය සඳහා පිළියෙල කරන ලද සංස්ථාවේ ක්‍රියාත්මක සැලැස්මේ කෙටුම්පත, පිළිබඳවද දීර්ඝ වශයෙන් කමිටුව විසින් සමාලෝචනය සිදු කරන ලදී.

එහිදී අදාළ ක්‍රියාත්මක සැලැස්මේ අන්තර්ගතවූ අභ්‍යන්තර විගණන සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම සම්බන්ධයෙන්ද සාකච්ඡාවට භාජනය වූ අතර, ඒ අනුව සමස්ථ සංශෝධනයන් සහිතව අදාළ ක්‍රියාත්මක සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා නිර්දේශ කිරීම කමිටුව විසින් නිර්දේශ කරන ලදී. එමෙන්ම 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ අවසාන ගිණුම් වාර්තා පිළියෙල කිරීම සම්බන්ධයෙන් ජාතික විගණන කාර්යාලය මගින් ඉදිරිපත්කර තිබූ නිරීක්ෂණවලට අනුව ඇති වී තිබූ ගැටළු සහගත තත්ත්වය පිළිබඳව කමිටුවේ විමර්ශනයට

භාජනය වූ අතර, ඒ සම්බන්ධයෙන් අදාළ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.



සී.සී.මුහන්දිරම්ගේ

සභාපති
විගණන හා කළමනාකරණ කමිටුව

7. 2020 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාව

7.1 කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය හා සංවර්ධන වැඩසටහන්

භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය යටතේ මෙම වර්ෂය තුල බද්ධ කජු අක්කර 1,936ක්, බීජ කජු අක්කර 745ක්, බද්ධ ගෙවතු වගා කජු අක්කර 680ක් හා බීජ ගෙවතු වගා කජු අක්කර 139ක් වශයෙන් මුළු අක්කර 3,500ක් දිස්ත්‍රික්ක 19ක් ආවරණය වන පරිදි වගාකර ඇත. ගොවි පවුල් 7,709ක් සඳහා මෙමගින් ප්‍රතිලාභ ලැබුණි. ගොවි පුහුණු වැඩසටහන් 39ක් පැවැත්වූ අතර, ඒ සඳහා ගොවීන් 1,269ක් සහභාගී විය. මේ සඳහා වැයවුණු මුළු වියදම රු.මි. 16.23කි.

7.2 වගාවේ ඵලදායීතාවය ඉහළ නැංවීම

7.2.1 රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

විවිධ ප්‍රදේශවලට උචිත නව ප්‍රභේද අභිජනනය කර කුඩා කජු ඉඩම් හිමියන් වෙත ලබාදීම සඳහා මාතලේ දිස්ත්‍රික්කයේ නාලන්ද, අනුරාධපුරය දිස්ත්‍රික්කයේ විලච්චිය, අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය, මොණරාගල දිස්ත්‍රික්කයේ සුදුවතුර ආර සහ පුත්තලම දිස්ත්‍රික්කයේ එළුවන්කුලම යන බීජ උද්‍යාන නඩත්තු කරන ලදී. මේ යටතේ එළුවන්කුලම බීජ උද්‍යානයේ අක්කර 15ක කජු වගාවක් සිදු කරන ලදි. ව්‍යාප්ති සේවා සහ වාණිජමය කාර්යන් සඳහා අවශ්‍ය බද්ධ පැළ නිෂ්පාදනය සඳහා අවශ්‍ය ඉහළ ගුණාත්මයෙන් සමන්විත මවුබීජ 500,000ක් හා අංකුර 520,000ක් මෙමගින් ලබාගන්නා ලදී. මේ සඳහා වැයවූ මුළු මුදල රු.මි. 23.98කි.

7.2.2 නිෂ්පාදනය වැඩිදියුණු කිරීම

කජු වගාවේ රෝග හා පළිබෝධ මර්දනය හා ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතයෙන් (GAP) ඵලදායීතාවය ඉහළ නැංවීමේ අරමුණින් ‘‘හෙලෝපෙල්ටිස්’’ මකුණාගේ හානිය සහ කඳ හා මුල් විඳින පණු රෝග මර්දනය කිරීම සඳහා පළිබෝධ මර්දන වැඩසටහන් දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව, ජාතික වැවිලි

කළමනාකරණ ආයතනයේ අනුග්‍රහයෙන් ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතය හා කජු වගාවේ පළිබෝධ මර්දනය පිළිබඳ පුහුණු වැඩසටහන් 02ක් පවත්වා ඇති අතර ඒ සඳහා ගොවීන් 100ක් සහභාගී විය.

7.2.3 පැළ තවාන් කළමනාකරණය

සංස්ථාවේ මධ්‍යම පැළ තවාන් 07ක් කමන්දළුව, මහියංගණය, හාඩි, මිහින්තලේ, චන්ද්‍රිකාවැව, දඹුල්ල හා කුඹුක්කන පිහිටා ඇත. නවීන තාක්ෂණය උපයෝගී කරගෙන බද්ධ පැළ නිපදවීම සඳහා සාදන ලද පොලිදැල් ගෘහ 06ක් කමන්දළුව, මිහින්තලේ, මඩකළපුව, අළුත්තරම පැළ තවාන්වල ඉදිකර ඇත. මෙම තවාන්වල 2020 මහ කන්නය සඳහා උසස් තත්ත්වයේ බද්ධ පැළ 422,570ක් නිෂ්පාදනය කර ගොවීන්වෙත ලබාදෙන ලදී. මේ සඳහා වැයවූ මුදල රු.මි. 18.28 කි.

7.2.4 සංවර්ධන ව්‍යාපෘති සඳහා පැළ ලබාදීම

2020 වර්ෂයේදී **"අපනයන ආශ්‍රිත කජු පොකුරු ගම්මාන ව්‍යාපෘතිය"** උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය දායකත්වයෙන් බද්ධ කජු පැළ 100,000ක් මුලතිව්, වවුනියාව, කිලිනොච්චිය, පුත්තලම, අනුරාධපුරය දිස්ත්‍රික්කයන්හි අක්කර 1,428ක් වගා කිරීම සඳහා ප්‍රතිලාභීන් වෙත බෙදාදෙන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා රාජ්‍ය අමාත්‍යාංශයෙන් රු.මි. 25.8ක් ලබාදෙන ලදී.

7.3 පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්

වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා ඒකාබද්ධව පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. ශාක අභිජනනය, පොහොර භාවිතය, පැළ ඝනත්වය, කජු වගාවේ රෝග හා පළිබෝධ මර්දනය, අතුරු භෝග වගාව, බද්ධ හා බීජ වගාවන්, බද්ධ කිරීමේ තාක්ෂණික ක්‍රමවේද අස්වැන්න පිළිබඳව පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. අදාළ පර්යේෂණ ප්‍රතිඵල සම්බන්ධයෙන් වැඩමුළු සහ ව්‍යාප්ති සේවාවන් මගින් ගොවීන් දැනුවත් කරනු ලැබේ. 2020 වර්ෂයේ වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා ඒකාබද්ධව නව කජු ප්‍රභේද 03ක් WUCC 02, WUCC 07, WUCC 16 ලෙස හඳුන්වාදෙන ලදී. මේ සඳහා වැයවූ මුදල රු.මි. 3.98කි.

7.4 සංස්ථා වතුයායන්වල නව වගාව සහ වගා පුනරුත්ථාපනය

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ පුත්තලම, කමන්දළුව, හාඩි, මාන්කර්ණි, පුනරීන් සහ තිරියාය යන වතුයායන්වල සංවර්ධන කටයුතු සිදු කළ අතර, පුනරීන් වතුයායේ වල් මර්දනය කිරීම සිදු කරන ලදී. පුත්තලම වතුයායේ අක්කර 180ක වල් මර්දනය සිදුකර පෞද්ගලික අංශයේ ව්‍යවසායකයකු වෙත අතුරුභෝග වගාව සඳහා ලබා දෙන ලදී. එසේම මන්නාරම දිස්ත්‍රික්කයේ පිහිටි වෙල්ලන්කුලම වතුයාය අත්පත් කර ගන්නා ලද අතර එහි අක්කර 200ක සංවර්ධන කටයුතු සිදු කරන ලදී.

මීට අමතරව කොණ්ඩච්චි වතුයායේ පැළ 3,600ක්, සුදුවතුර ආර බීජ උද්‍යානයේ පැළ 2,000ක් සහ මහඔය බීජ උද්‍යානයේ පැළ 1,500ක් ලෙස පාළු පැළ සිටුවීම සිදු කරන ලදී. මෙම වැඩසටහන් සඳහා භාණ්ඩාගාර අරමුදල් රු.මි. 10.63ක් ලැබී ඇත.

එසේම සංස්ථාව උපයන ආදායම් මගින් ඵලදායීතාවය ඉහළ නැංවීම පිණිස රසායනික පොහොර යෙදීම, වල් මර්දන කටයුතු, රෝග හා පළිබෝධ මර්දනය, ක්ෂේත්‍ර මාවත් නඩත්තු කිරීම කප්පාදු කිරීම ආදිය ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේදයන්ට අනුකූලව සිදු කරන ලදී. මෙම වර්ෂයේ වතුයායන්වලින් මෙ.ටො. 149.46ක ලෙලිකජු අස්වැන්නක් ලැබුණි. මේ යටතේ පුත්තලම වතුයායේ පාළු පැළ 2,700ක්ද, විලච්චිය බීජ උද්‍යානයේ පාළු පැළ 400ක්ද සිටුවන ලදී. මේ සඳහා වැයවූ මුළු මුදල රු.මි. 30.11කි.

7.5 පසු අස්වනු තාක්ෂණය

7.5.1 අලෙවිකරණය හා පිරිසැකසුම් කර්මාන්ත ප්‍රවර්ධනය

සංස්ථා වතුයායන්ගෙන් ලද ලෙලිකජු අස්වැන්න සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් මිලදී ගත් ලෙලිකජු පුත්තලම සහ නැදගමුවෙහි පිහිටි පිරිසැකසුම් මධ්‍යස්ථානවලදී පිරිසැකසුම් කරන ලදී. ඒවා අගය එකතුකළ නිෂ්පාදන ලෙස සංස්ථාවේ ප්‍රධාන අලෙවි සැල් මගින් අලෙවිකරන ලදී. මේ සඳහා වරලත් අලෙවි සැල් 74කින් සමන්විත සංස්ථා අලෙවි සැල් ජාලයක් උපයෝගී කරගන්නා ලදි. එසේම කජු ආශ්‍රිත නව නිෂ්පාදන 04ක් දේශීය වෙළඳපොලට හඳුන්වාදෙන ලදී. මේ සඳහා භාණ්ඩාගාර අරමුදල් රු.මි.1.0ක් වැයවිය.

2020 වර්ෂයේ අලෙවි කටයුතු මගින් සංස්ථාව උපයන ලද මුළු ආදායම රු.මි. 47.23කි. 2020 වර්ෂයේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා අලෙවි ඉලක්ක සපුරාගත නොහැකි විය. මෙයට අමතරව සංස්ථාව උපයන ආදායම් මගින් පුත්තලම සහ නැදගමුව කපු පිරිසැකසුම් මධ්‍යස්ථානය නඩත්තු කරනු ලැබේ. මේ සඳහා වැයවූ මුදල රු.මි. 16.62 කි.

7.5.2 මානව සම්පත් සංවර්ධනය

කාර්ය මණ්ඩලයේ සියළුම තනතුරුවල නිලධාරීන්ගේ පුහුණුව හා සංවර්ධනය සඳහා අවශ්‍ය සේවාස්ථ පුහුණු සැසි පැවැත්වීමට කටයුතු සිදු කරන ලදී. මෙමගින් කාර්ය ඵලදායීතාවය ඉහළ නැංවීමටත් ඔවුන්ගේ විෂය දැනුම යාවත්කාලීන කිරීමටත්, නව දැනුම ලබාගැනීමටත් අවස්ථාව සැලසුණු අතර, ස්වයං පෙළඹවීම මගින් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට ඉඩ ප්‍රස්ථාව සැලසුනි. 2020 වසර තුළ සේවකයින්ගේ හැකියාව සහ වෘත්තීමය ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වෘත්තීය පුහුණුව හා මහපෙන්වීම යටතේ සංස්ථා කාර්ය මණ්ඩලයේ කළමනාකරණ සහකාරවරුන් 50ක් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාළ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

8. කාර්යසාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා සංස්ථාව විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රධාන මධ්‍යකාලීන ක්‍රියාමාර්ග කිහිපයකි.

01. ශ්‍රී ලංකාවේ කජු වගා වපසරිය ඉහළ නැංවීම
02. කජු වගා ඉඩම්වල ඵලදායීතාවය ඉහළ නැංවීම
03. කජු වගාවේ පසු අස්වනු තාක්ෂණය ප්‍රවර්ධනය
04. මානව සම්පත් සංවර්ධනය හා ඵලදායීතාවය ඉහළ නැංවීම.

8.1 ශ්‍රී ලංකාවේ කජු වගා වපසරිය ඉහළ නැංවීම

8.1.1 ව්‍යාප්ති වැඩසටහන් යටතේ කජු වගාව

ශ්‍රී ලංකාවේ කජු වගාව ප්‍රධාන වශයෙන් වියළි කලාපය තුල ව්‍යාප්තව ඇත. පසුගිය දශක 03ක කාලයක ක්‍රියාත්මක වූ යුධමය වාතාවරණය හේතුවෙන් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල පිහිටි කජු වගා බිම් අක්කර 30,000ක් පමණ විනාශ විය. එහෙත් වර්ෂ 2010 සිට සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාප්ති වැඩසටහන් යටතේ වර්ෂයකට අක්කර 7,000කට අධික ඉඩම් ප්‍රමාණයක් කජු වගාවට නැඹුරු කරවීමට සමත්විය.

භාණ්ඩාගාර අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාප්ති සහනාධාර යෝජනා ක්‍රමය යටතේ බද්ධ හා බීජ කජු වගාව වර්ෂයකට අක්කර 3,500 බැගින් ඉදිරි වසර 03 තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අතර ගෙවතු වගාව යටතේ වර්ෂයකට අක්කර 1,000ක් පමණ වගා කිරීමට ද සැලසුම් කර ඇත.

8.1.2 වගා පුනරුත්ථාපනය

සංස්ථා වතුයායන්වල නව වගාව හා පැරණි වගා පුනරුත්ථාපනය කිරීම 2011 වර්ෂයේ සිට ආරම්භ කරන ලදී. මේ යටතේ උතුරු පළාතේ කොණ්ඩච්චි වතුයාය, පුනරීන් වතුයාය, වෙල්ලන්කුලම වතුයාය හා නැගෙනහිර පළාතේ මාණ්කර්නි වතුයාය සංවර්ධනය සහ පුනරුත්ථාපන කටයුතු සංස්ථාව විසින් සිදුකරගෙන යනු ලබයි.

8.1.3 නව වගාව

පෞද්ගලික, කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ඉඩම් හිමියන් සතු කජු වගාවන්වල නව වගාවද වාර්ෂිකව අක්කර 500ක පමණ සිදු කෙරෙන අතර, ඉදිරි වසර තුන තුල මෙම වගා නැඹුරුව අඛණ්ඩව පවතිනු ඇත. ඉහත සියළු වගා වැඩසටහන් මගින් අවම වශයෙන් වාර්ෂිකව අක්කර 7,000 බැගින් කජු වගා භූමි ප්‍රමාණය ඉහළ නැංවීමට කටයුතු කරනු ඇත.

මෙම කාර්යන් සාර්ථකව ඉටු කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාල 11 කින් සමන්විත ව්‍යාප්ති සේවා ජාලයක් ක්‍රියාත්මක කරනු ලබන අතර, දිස්ත්‍රික්ක 19ක කජු වගා සංවර්ධන කටයුතු මෙමගින් ආවරණය කරනු ලබයි.

8.1.4 සංවර්ධන ව්‍යාපෘති සඳහා කජු පැළ ලබාදීම

2020 වර්ෂයේදී උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මුල්‍ය දායකත්වයෙන් **"අපනයන ආශ්‍රිත කජු පොකුරු ගම්මාන ව්‍යාපෘතිය"** යටතේ බද්ධ කජු පැළ 100,000ක් මුලතිව්, වවුනියාව, කිලිනොච්චිය, පුත්තලම, අනුරාධපුරය යන දිස්ත්‍රික්කයන්හි අක්කර 1,428ක් වගා කිරීම සඳහා ප්‍රතිලාභීන් වෙත බෙදාදෙන ලදී.

මෙමඟින් මධ්‍යම පරිමාණයේ ව්‍යවසායකයින් හට කජු පැළ 100,000ක් ලබාදීමටත්, ගොවි පවුල් 1,428ක ආර්ථික සහ සාමාජීය මට්ටම ඉහළ නැංවීමටත් බලාපොරොත්තු වේ. මෙවැනි සංවර්ධන ව්‍යාපෘති ඉදිරි වර්ෂ වලදීද ක්‍රියාත්මක කිරීම තුලින් කජු වගා වපසරිය ඉහළ නැංවීම මෙහි මූලික අරමුණක් වේ.

8.2 කජු වගා ඉඩම්වල ඵලදායීතාවය ඉහළ නැංවීම

ශ්‍රී ලංකාවේ කජු වගා වපසරිය අක්කර 169,289ක් පමණ වන අතර, මින් 88%ක් පමණ කුඩා ඉඩම් හිමියන් වේ. බහුතරයක් ඉඩම්වල බීජ කජු ගස් වගාකර ඇති අතර, සංස්ථා වතුයායන්වල මෙන්ම මෙම ඉඩම්වලද කජු ගස්වල වයස අවුරුදු 20-35 පමණ වන අතර, එක් ගසකින් ලෙලිකජු කි.ග්‍රෑ. 3-5 අතර ප්‍රමාණයක් ලැබේ. වැඩි දියුණු කරන ලද නව කජු ප්‍රභේදවලින් සමන්විත කජු වගාවන් ඇති වියට්නාමය,

ඉන්දියාව වැනි රටවල ගසකින් කි.ග්‍රෑ. 10-15 අතර අස්වැන්නක් ලැබේ. මේ අනුව වගාවේ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා සංස්ථාව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරයි.

8.2.1 නව ප්‍රභේද හඳුන්වාදීම

මේ අනුව වැඩි අස්වැන්නක් ලබාදෙන වැඩිදියුණු කළ නව ප්‍රභේද 11ක් සංස්ථාව විසින් ගොවීන් වෙත හඳුන්වා දී ඇත. වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා ඒකාබද්ධව පර්යේෂණ කටයුතු සිදුකෙරෙන අතර, WUCC 01, WUCC 02, WUCC 05, WUCC 07, WUCC 08,WUCC 09, WUCC 13, WUCC 16, WUCC 19, WUCC 21, WUCC 23 යන ප්‍රභේද 11 එළුවන්කුලම, විලච්චිය, නාලන්ද, මහඔය හා සුදුවතුර ආර යන බීජ උද්‍යානවල වගා කර ඇත. මෙම මව්ශාක වලින් අංකුර ලබාගෙන දිවයිනේ විවිධ දේශගුණික කලාපවලට උචිත නව ප්‍රභේද අභිජනනය කර ගොවීන් වෙත ලබාදීමට කටයුතු කරනු ලැබේ. වාර්ෂිකව නව ප්‍රභේද 02 බැගින් හඳුන්වාදීමට කටයුතු කරන අතර, මෙමගින් හෙක්ටයාරයකට ලැබෙන අස්වැන්න කි.ග්‍රෑ.1,000 දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

8.2.2 ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතය

ඉතා අඩු අස්වැන්නක් ලබාදෙන බීජ කජු ගස් ඉවත්කර නැවත වගාව සිදුකිරීම සඳහා කුඩා ඉඩම් හිමියන් වාර්ෂිකව යොමු කරනු ලැබේ. ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතයෙන් (GAP) කජු වගාවේ අස්වනු ඵලදායීතාවය ඉහළ නැංවීම අරමුණු කර ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සහභාගීත්වය මත ගොවීන් පුහුණු කිරීමේ වැඩසටහන් වාර්ෂිකව සිදුකරනු ලැබේ. මෙය ඉදිරි වර්ෂ තුන තුලදී ද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

දෘෂ්‍ය මාධ්‍ය මේ සඳහා උපයෝගී කරගනු ලැබේ. කජු ගස්වල මල් හටගන්නා කාලය තුල අධික වර්ෂාපතනය පැවතීම නිසා දළුමැරීමේ රෝගය ව්‍යාප්ත විය.

මේ නිසා කජු අස්වැන්න 30% - 40% අතර ප්‍රමාණයකින් අඩුවේ. මේ සඳහා කුඩා ඉඩම් හිමියන් දැනුවත් කිරීම අත්‍යාවශ්‍ය වී ඇත. පරිණත කජු වගාවන් තුල ඇති කඳපණු හානිය මර්දනය කිරීම සඳහා පර්යේෂණ අංශ සමඟ ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කරන අතර මෙය ඉදිරි වර්ෂ තුන තුලදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

8.2.3 මධ්‍යම පැළ තවාන්

සංස්ථාවේ මධ්‍යම පැළ තවාන් මිහින්තලේ, දඹුල්ල, කමන්දළුව වතුයාය, මහියංගණය, කුඹුක්කන, හාඩි වතුයාය හා වන්ද්‍රිකාවැව යන ස්ථාන වල ස්ථාපිත කර ඇත. මෙම තවාන් මගින් නව ප්‍රභේද වලින් සමන්විත ඉහළ ගුණාත්මයෙන් යුක්ත බද්ධ පැළ සංස්ථා නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ නිෂ්පාදනය කර ගොවීන් වෙත නිකුත් කරනු ලැබේ.

වාර්ෂිකව බද්ධ පැළ 400,000ක් පමණ නිෂ්පාදනය කරන අතර, ඉදිරි වර්ෂ 03 තුලදීද වසරකට පැළ 400,000ක් බැගින් නිපදවීම අරමුණු කර ඇත. පැළ නිෂ්පාදනයේදී නව තාක්ෂණය භාවිතය වැඩිදියුණු කෙරෙනු ඇත.

8.3 කජු වගාවේ පසු අස්වනු තාක්ෂණය ප්‍රවර්ධනය

ශ්‍රී ලංකාවේ නිපදවන කජු මදවල රසවත් බව, විශාලත්වය හා ආවේණික වර්ණයෙන් යුක්ත වීම නිසා ලෝක වෙළඳපොල තුල අධික ඉල්ලුමක් ඇතිවී ඇත. එහෙත් වාර්ෂිකව නිෂ්පාදනය වන ලෙලිකජු මෙ.ටො. 10,000-12,000ක පමණ වාර්ෂික අස්වැන්න මගින් මෙම අපනයන ධාරිතාවය ක්ෂණිකව ඉහළ නැංවීම දුෂ්කර වී ඇත. දේශීය කජු මද පරිභෝජනය ද ඉහළ ගොස් ඇත.

මීට අමතරව කජු මද කිලෝවක නිෂ්පාදන වියදම ඉහළයාම නිසා කජු මද කිලෝවක මිල රු. 3,000/-ත් රු. 4,000/-ත් අතර පරාසයක පවතී. මෙම කරුණු සැළකිල්ලට ගෙන කජු මද නිෂ්පාදනවල ගුණාත්මය හා ලාභය ඉහළ නැංවීම සඳහා සංස්ථාව විසින් ක්‍රියාමාර්ග රාශියක් ගෙන ඇත.

8.3.1 ප්‍රශස්ත නිෂ්පාදන ක්‍රමවේද භාවිතය

සංස්ථාව විසින් කුඩා පරිමාණ ව්‍යවසායකයන් සඳහා ප්‍රමිතිකරණය, අගය එකතු කිරීම හා ප්‍රශස්ත නිෂ්පාදන ක්‍රමවේද (GMP) භාවිතයෙන් නිෂ්පාදනවල තත්ත්වය ඉහළ නැංවීම, සෞඛ්‍යාරක්ෂිත නිෂ්පාදන ක්‍රමවේද භාවිතය, නව තාක්ෂණය සහිතව පිරිසැකසුම් ක්‍රියාවලිය නවීකරණය කිරීම, අඩු වියදම් විජලන යන්ත්‍ර භාවිතය හා නව ඇසුරුම් ක්‍රම හා නව නිෂ්පාදන සඳහා ව්‍යවසායකයන් උනන්දු කිරීම සිදුකෙරේ. මේ

සඳහා නැඳගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ පුහුණු මධ්‍යස්ථානය උපයෝගී කරගනු ලැබේ.

8.3.2 පුහුණු වැඩසටහන්

කුඩා පරිමාණ නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ජාත්‍යන්තර ප්‍රමිති තත්ත්වයන් දක්වා ඉහළ නැංවීමට සංස්ථාවේ දායකත්වය ලබාදුන් අතර, වාර්ෂිකව පිරිසැකසුම් කර්මාන්තයේ නියැලෙන්නන් 50ක් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කර ඇත. මෙම වැඩසටහන් ඉදිරි වසර 03 තුල අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබේ.

පිරිසැකසුම් කර්මාන්තය ආරම්භ කරන්නන් හට අවශ්‍ය විදුලිබලයෙන් ක්‍රියාකරන කැපීමේ යන්ත්‍ර (Shelling Machine) හා විජලන යන්ත්‍ර (Ovens) සංස්ථාවේ මැදිහත්වීම මත පහසුම්ලට ලබාදීමේ වැඩසටහනක්ද ක්‍රියාත්මක කෙරෙන අතර, මෙය අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.

8.3.3 ලෙලි කජු මිලදී ගැනීම

සංස්ථා වතුයායන් වලින් ලැබෙන ලෙලි කජු අස්වැන්නට අමතරව පිරිසැකසුම් කර්මාන්තශාලාවල අඛණ්ඩව වාර්ෂික නිෂ්පාදනය සිදුකිරීම සඳහා අවශ්‍ය ලෙලිකජු සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් මිලදී ගැනීම පසුගිය වසර තුලදී සිදු කරන ලදී. සංස්ථා වතුයායට අයත් කොණ්ඩව්වි වතුයායේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් අක්කර 935ක් පමණ වගාකර ඇති අතර, එම කජු වෙළඳපොල මිලට වඩා අඩු මිලට සංස්ථාවට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් ලබාදෙනු ලැබේ. වෙළඳපොල තරඟකාරී තත්ත්වයන්ට මුහුණදීම සහ පිරිවැය අවමකිරීමේ පරමාර්ථයෙන් මෙම ලෙලිකජු මිලදීගැනීම සිදු කරන ලදී. ඉදිරි වර්ෂ 3 තුලදී ද මෙම ලෙලි කජු මිලට ගැනීමට කටයුතු කරනු ලැබේ.

8.3.4 කජු අතුරු නිෂ්පාදන ප්‍රවර්ධනය

කජු අස්වැන්න මගින් ප්‍රධාන වශයෙන්ම ලෙලිකජු වෙන් කරගන්නා අතර කජු පුහුලන් ප්‍රයෝජනයට නොගෙන අපතේ යයි. මේ අනුව වාර්ෂිකව කජු පුහුලන් මෙ.ටො.120,000කට අධික ප්‍රමාණයක් ප්‍රයෝජනයට නොගෙන විනාශ වී යයි. මෙම කජු පුහුලන් භාවිතකර Non-Alcoholic Beverages, ජෑම්, කෝඩියල් වැනි අතුරු

නිෂ්පාදන සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම, පුහුණුව ලබාදීම සහ පෞද්ගලික අංශය සමඟ නිෂ්පාදන සහ අලෙවි කටයුතු සම්බන්ධයෙන් ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබයි. මීට අමතරව කජු පුහුලන් මගින් වයින් සහ ස්ප්‍රිතු නිෂ්පාදනය කිරීම සඳහා ද ව්‍යාපෘති යෝජනාවක් සකස් කරමින් පවතින අතර ඉදිරි වර්ෂ වලදී මෙම ව්‍යපෘතිය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

8.4 මානව සම්පත් සංවර්ධනය හා ඵලදායීතාවය ඉහළ නැංවීම

8.4.1 මානව සම්පත් පුහුණු කිරීම හා සංවර්ධනය

කාර්ය මණ්ඩලයේ සියළුම තනතුරුවල නිලධාරීන්ගේ පුහුණුව හා සංවර්ධනය සඳහා අවශ්‍ය සේවාස්ථ පුහුණු සැසි පැවැත්වීමට කටයුතු සිදුකර ඇත. මෙමගින් කාර්ය ඵලදායීතාවය ඉහළ නැංවීමටත් ඔවුන්ගේ විෂය දැනුම යාවත්කාලීන කිරීමටත්, නව දැනුම ලබාගැනීමටත් අවස්ථාව සැලසෙන අතර, ස්වයං පෙළඹවීම මගින් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමටත් ඉඩ ප්‍රස්ථා සැලසේ. මෙම පුහුණු වැඩසටහන් ඉදිරි වර්ෂ 03 තුල අඛණ්ඩව සිදුකිරීමට සැලසුම් කර ඇත.

8.4.2 කාර්ය මණ්ඩල ව්‍යුහය ප්‍රතිසංවිධානය හා කාර්යසාධන ඇගයීම

සංස්ථාවේ ප්‍රාදේශීය කාර්යාල ජාලය සඳහා පරිගණක හා ෆැක්ස් යන්ත්‍ර ලබාදී ඇත. ඒ අනුව අන්තර්ජාල පහසුකම් සහිතව සන්නිවේදන කටයුතු නවීකරණය කර ඇත. වර්තමාන සංවර්ධන ක්‍රියාවලියට අනුරූප වන පරිදි සංස්ථාවේ කාර්ය මණ්ඩල ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම සිදුකළ අතර, ඒ අනුව බඳවාගැනීමේ හා උසස් වීමේ පටිපාටිය සංශෝධනය කිරීමටත් අවශ්‍ය පියවර ගෙන ඇත.

මෙමගින් කාර්ය මණ්ඩල ව්‍යුහය තුල කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය මූලිකාංග සහිතව සංස්ථාවේ ඉදිරි වසර කිහිපය තුල අභියෝග වලට මුහුණදීම සඳහා මෙම ව්‍යුහාත්මක වෙනස්කම් උපයෝගී කරගනු ඇත. සියළුම තනතුරුවල කාර්යසාධනය ඇගයීම් සිදුකිරීමටද අවශ්‍ය පියවර ගෙන ඇත.

9. කාර්යසාධනය පිළිබඳ වසර 05 ක සාරාංශය

අනු අංකය	විස්තරය	2020	2019	2018	2017	2016
01.	සහනාධාර යෝජනා ක්‍රමය යටතේ වගා කරන ලද කජු අක්කර ප්‍රමාණය	සහනාධාර වැඩසටහන 2,568 ගෙවතු වගාව 932 **එකතුව 3,500**	සහනාධාර වැඩසටහන 2,681 ගෙවතු වගාව 1,819 **එකතුව 4,500**	සහනාධාර වැඩසටහන 3,305 ගෙවතු වගාව 1,195 **එකතුව 4,500**	සහනාධාර වැඩසටහන 4,500	සහනාධාර වැඩසටහන 4,500
02.	සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබන ගොවි පවුල් සංඛ්‍යාව	7,676	11,069	11,818	14,932	3,750
03.	නිෂ්පාදනය කරන ලද පැළ ගණන	බද්ධ පැළ 422,570 බීජ පැළ 54,500 **එකතුව 477,570**	බද්ධ පැළ 270,294 බීජ පැළ 79,945 **එකතුව 350,239**	බද්ධ පැළ 197,353 බීජ පැළ 80,007 **එකතුව 277,360**	බද්ධ පැළ 328,456 බීජ පැළ 105,480 **එකතුව 433,936**	බද්ධ පැළ 218,373 බීජ පැළ 80,000 එකතුව **298,373**
04.	එක්රැස් කරන ලද මව්බීජ සංඛ්‍යාව	500,000	500,000	484,753	560,000	600,000
05.	එක්රැස් කරන ලද අංකුර ප්‍රමාණය	520,000	310,000	164,500	200,000	310,000
06.	ලබාගත් ලෙලි කජු අස්වැන්න (මෙ.ටො.)	149.46	157.81	83.52	66.4	106
07.	සංස්ථා වතුයායන් වල නව වගාව (අක්කර)	346	52.5	65.0	433	250

අනු අංකය	විස්තරය	2020	2019	2018	2017	2016
08.	වරලත් අලෙවිසැල් සංඛ්‍යාව	74	55	60	56	39
09.	තාක්ෂණ හුවමාරු වැඩසටහන්, පළිබෝධ පාලනය සහ පසු අස්වනු තාක්ෂණය යටතේ පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	82	166	139	197	126
10.	පුහුණු කරන ලද ගොවීන් සංඛ්‍යාව	1,369	2,320	3,550	3,574	1,833
11.	ආනයනය කරන ලද කපු ප්‍රමාණය (මෙ.ටො.)	ලෙලි කපු 549.2 කපු මද 0.025	ලෙලි කපු 527.26 කපු මද 0.826	ලෙලි කපු 2,378.02 කපු මද 156.41	ලෙලි කපු 2,108.22 කපු මද 160.82	ලෙලි කපු 1,622 කපු මද 263
12.	කපු ආනයන බලපත්‍ර නිකුත් කරන ලද මෙ.ටො. ප්‍රමාණය	500	-	4,255	6,000	2,910
13.	කපු අපනයනය කරන ලද ප්‍රමාණය මෙ.ටො.	34.32	47.40	60.81	59.04	57.64

අනු අංකය	විස්තරය	2020	2019	2018	2017	2016
14.	කපු අපනයනය කරන ලද වටිනාකම (රු.මි.)	81.13	93.57	144.62	143.51	99.98
15.	ලෙලිකපු සහ කපු මද මිලදි ගැනීම (මෙ.ටො.)	ලෙලිකපු 64.00 කපු මද -	ලෙලි කපු 20.00 කපු මද 2.30	ලෙලිකපු - කපු මද 5.30	ලෙලිකපු 63.00 කපු මද 4.80	ලෙලිකපු 21.94 කපු මද 19.97
16.	අගය එකතු කරන ලද කපු මද විකුණුම් ප්‍රමාණය (මෙ.ටො.)	16.91	21.72	24.74	27.80	30.94
17.	අගය එකතු කරන ලද කපු මඳ විකිණීමෙන් ලද ආදායම වටිනාකම (රු.මි.)	47.23	79.08	83.15	87.96	84.59

10. විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන

2020.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

		2020	2019
		(රු)	(රු)
විකුණුම්	01	109,120,346.83	100,082,839.37
විකුණුම් පිරිවැය	02	72,190,471.63	67,857,577.72
දළ ලාභය (අලාභය)		**36,929,875.20**	**32,225,261.65**
රාජ්‍ය ප්‍රදාන (පුනරාවර්තන)		60,000,000.00	60,000,000.00
වෙනත් ආදායම්	03	43,300,474.48	48,343,281.71
		140,230,349.68	**140,568,543.36**
බෙදාහැරීමේ වියදම්	04	10,583,914.69	8,437,210.80
පරිපාලන වියදම්	05	131,122,235.93	132,329,845.72
වෙනත් වියදම්	06	9,216,939.55	29,739,778.69
මූල්‍ය වියදම්		192,906.32	246,958.89
		151,115,996.49	**170,753,794.10**
		(10,885,646.81)	**(30,185,250.74)**
බදු පෙර ලාභය/(අලාභය)		**(10,885,646.81)**	**(30,185,250.74)**
ආදායම් බදු (වෙන්කිරීම්)		-	-
වෙනත් විස්තීරණ ආදායම්		-	-
මුළු විස්තීරණ ආදායම්		**(10,885,646.81)**	**(30,185,250.74)**

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශයට අදාළ සටහන්

සටහන් - 01

විකුණුම්	**2020**	**2019**
කපු මද	48,462,877.83	82,767,072.85
අඩුකලා : ආපසු එවුම්	(1,231,362.00)	(178,357.40)
	47,231,515.83	82,588,715.45
පැළ	32,312,630.00	15,645,315.00
ලෙලි කපු	29,576,201.00	-
පොල්	-	1,848,808.92
	109,120,346.83	**100,082,839.37**

සටහන් - 02

විකුණුම් පිරිවැය

ආරම්භක තොගය	7,909,576.46	5,879,788.42
කපු මද	3,801,512.96	3,039,403.94
කපු පැළ	4,108,063.50	2,840,384.48
එකතු කලා - ගැණිලි		
පළ දරණ පොල් වගාව	-	92,900.00
ගැණිලි	26,560,000.00	-
නිෂ්පාදන වියදම්- කපු මද	42,372,991.30	65,192,141.20
නිෂ්පාදන වියදම් - කපු පැළ	21,959,266.92	19,990,122.35
	90,892,258.22	85,275,163.55
	98,801,834.68	91,154,951.97
අඩුකලා - අවසන් තොගය		
කපු මද	4,336,211.00	3,801,512.96
කපු පැළ	11,794,044.10	4,108,063.50
පොල්	-	-
අඩුකලා:		
අභ්‍යන්තර මාරුකිරීම් (පැළ)	9,440,528.80	13,274,284.47
මැරුණු පැළ	603,298.40	1,550,839.68
නියැඳි සහ ත්‍යාග	437,280.75	562,673.64
	26,611,363.05	23,297,374.25
	72,190,471.63	**67,857,577.72**

සටහන් - 03

වෙනත් ආදායම්

පොළී ආදායම් (ඉතුරුම් ගිණුම්)	197,688.74	65,809.59
පොළී ආදායම් (ආපදා ණය/ විශේෂ ණය)	25,767.62	44,692.29
ලෙලි කපු ආනයන සේවා ගාස්තු	5,000,000.00	235,000.00
විවිධ ආදායම්	4,881,009.61	2,931,656.17
සංචාරක බංගලා කුලී ආදායම්	29,000.00	114,950.00
වන්දි ලැබීම්	-	336,000.00
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රම ක්ෂයකිරීම	31,426,875.82	44,615,173.66
පොල් වගාවෙන් ලද ලාභය	1,740,132.69	-
	43,300,474.48	**48,343,281.71**

සටහන් - 04

	සංස්ථාව ඉපැයූ ආදායම් - 2020	ප්‍රාග්ධන ප්‍රදාන 2020	2020	2019
අලෙවි සංවර්ධනය	-	34,350.00	34,350.00	-
විකුණුම් හා බෙදාහැරීමේ වියදම්	10,549,564.69	-	10,549,564.69	8,437,210.80
	10,549,564.69	**34,350.00**	**10,583,914.69**	**8,437,210.80**

සටහන් - 05

පරිපාලන වියදම්

	සංස්ථාව ඉපැයූ ආදායම් - 2020	ප්‍රාග්ධන ප්‍රදාන 2020	2020	2019
වාණිජ පැළ තවාන්	1,901,633.83	-	1,901,633.83	2,049,901.85
ප්‍රධාන කාර්යාලය	114,273,713.49	-	114,273,713.49	116,496,751.31
පොල් වගාව ක්‍රමක්ෂය කිරීම	-	-	-	226,020.27
අලෙවි කටයුතු	-	-	-	890,247.94
පළ නොදරන වගාව	-	2,895,142.71	2,895,142.71	-
මානව සම්පත් සංවර්ධනය	-	13,934.00	13,934.00	171,197.90
ව්‍යාප්ති අංශය	-	8,209,572.92	8,209,572.92	9,281,500.48
පර්යේෂණ සහ සංවර්ධනය	-	3,828,238.98	3,828,238.98	3,214,225.97
	116,175,347.32	**14,946,888.61**	**131,122,235.93**	**132,329,845.72**

සටහන් - 06

වෙනත් වියදම්

	සංස්ථාව ඉපැයූ ආදායම් - 2020	ප්‍රාග්ධන ප්‍රදාන 2020	2020	2019
හෙලෝපෙල්ටිස් පාලන වැඩසටහන	-	66,971.31	66,971.31	652,429.07
හානි සහ අලාභ (වයින්)	-	-	-	251,677.48
ඔයාමඩුව වතුයාය ගිණුම වසා දැමීම	-	-	-	14,480,914.24
පැළ සඳහා පිරිවැය	-	7,991,791.84	7,991,791.84	12,520,339.09
මැරුණු පැළ වලින් වූ අලාභය (තවාන් වලින්)	603,298.40	-	603,298.40	1,550,839.68
මැරුණු පැළ වලින් වූ අලාභය (ගිණිගැනීමෙන්)	-	554,878.00	554,878.00	283,579.13
	603,298.40	**8,613,641.15**	**9,216,939.55**	**29,739,778.69**
	127,328,210.41	**23,594,879.76**		

පදනම් කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - 2020

01. පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මත ගිණුම් පිළියෙල කර ඇත.

02. ස්ථාවර වත්කම් සරළ මාර්ග ක්‍රමය මත ක්ෂය කරන ලදී. වර්ෂය තුල මිලට ගත් වත්කම් ගත් දිනය පදනම් කරගෙන ක්ෂය ගණනය කරන ලදී. වර්ෂය තුල නිම කරන ලද ගොඩනැගිලි නිම කරන ලද දිනය පදනම් කරගැනීමෙන් නොව මුළු වර්ෂය සඳහාම ක්ෂය ගණනය කරන ලදී.

ක්ෂය කිරීමේ ප්‍රතිශත පහත සඳහන් පරිදි වේ

මෝටර් වාහන	20%
යන්ත්‍ර සුත්‍ර	10%
මෙවලම් හා උපකරණ	10%
කාර්යාලීය උපකරණ	10%
නළ ලිං/වගා ලිං	10%
ලී බඩු උපකරණ සහ සවිකිරීම්	06%
ස්ථීර ගොඩනැගිලි	03%
අර්ධ ස්ථීර ගොඩනැගිලි	33 1/3%

03. දේපල, පිරියත සහ උපකරණ ලෙස හඳුනාගත් වත්කම් පිරිවැයට ගිණුම්ගත කර ඇත.

දේපල, පිරියත සහ උපකරණවල අගය ප්‍රත්‍යාගණන වටිනාකම මත සමුච්චිත ක්ෂය හා හානිකරන ලද අලාභ අඩුකර දක්වා ඇත.

04. පහත සඳහන් පදනම මත තොග ගණනය කරන ලදී

කජු මද	:	ශුද්ධ විකුණුම් මිලෙන්
බිජ කජු	:	සහතික කළ වෙනස් වන මිල/වෙළෙඳ පොළ මිල
ගව සහ බැටළු	:	ඒ ඒ පළාත්වල වෙළෙඳ මිල/ජීව බර අනුව
පොල්	:	ශුද්ධ විකුණුම් මිල
අනෙකුත් සියළුම තොග:		පිරිවැයට ගණනය කරන ලදී.

05. ප්‍රධාන කාර්යාලීය වියදම් පිරිවැය මධ්‍යස්ථාන අතර එහි අන්තර්ගත මුළු වැටුප් වියදමට අදාළව බෙදා හරින ලදී.

06. වතුයායන්හි සාමාන්‍ය වියදම් එල දරණ සහ එල නොදරණ වගාවන්, පැළ තවාන් සහ සත්ව පාලනය අතර බෙදීම එම ප්‍රදේශ සඳහා වැයවූ සත්‍ය කම්කරු දින ගණනේ අනුපාතය අනුව බෙදා හරින ලදී.

07. එල දරණ වගාවල ක්‍රමක්ෂය කිරීම වර්ෂයකට 5% බැගින් ගණනය කරන ලදී.

08. බොල් ණය සහ අඩමාන ණය වෙන් කිරීම මුළු ණය ගැතියන්ගෙන් 3.53% බැගින් ගණනය කර ඇත. වෙන් කිරීම් ගිණුමේ වෙනස වර්ෂය තුල බොල් ණය කපා හැරීම සඳහා මාරු කරන ලදී.

09. පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීම පාරිතෝෂික දීමනා පනතේ සඳහන් පරිදි සේවය කරන ලද සම්පූර්ණ වර්ෂ ගණනකට අනුව ගණනය කරන ලදී. පාරිතෝෂික හිමිකම් ලැබීම සඳහා පනතේ සඳහන් අවම සේවා කාලය ගිණුම් වර්ෂය තුලදී සම්පූර්ණ වූ අයගේ සේවා පිරිවැය ආදායම් ගිණුමට හර කර ඇත.

10. ලැබූ හා ලැබිය යුතු දෑවල වටිනාකම මත ආදායම ගිණුම්ගත කර ඇත.

පහත සඳහන් දෑ සැලකිල්ලට ගෙන භාණ්ඩ විකිණීමේ ආදායම හඳුනාගෙන ඇත.

- ආයතනය අවදානම හා ප්‍රතිලාභ යන දෙකම ගැණුම්කරුට ලබාදේ.
- ආයතන කළමනාකාරිත්වයේ මැදිහත්වීමක් විකුණන භාණ්ඩවල හිමිකාරිත්වයට හෝ කාර්යක්ෂම පාලනයක් තබා ගැනීම සඳහා මැදිහත් නොවේ.
- ආදායම විශ්වාසනීය ලෙස හඳුනාගත හැකි වීම.
- ගණුදෙනු හා අදාළ ආර්ථික ප්‍රතිලාභයන් ආයතනයට ගලා යා හැක.
- ගණුදෙනුවට අදාළ වූ හෝ අදාළ විය හැකි පිරිවැය විශ්වාසනීය ලෙස අගය කිරීම.

11. ප්‍රාග්ධන වත්කම්හි ක්ෂයවීම් හා ක්‍රමක්ෂය ලෙස ගිණුම් පොත්වලට ඇතුලත් කර ඇති සත්‍ය වටිනාකම්, අදාළ ප්‍රාග්ධන වත්කම්වලින් කපා හැරීමෙන් අනතුරුව ඊට සමාන වටිනාකමක් ප්‍රාග්ධන ප්‍රදානවලින් ඉවත් කර ගිණුම්පොත් වල ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

12. මෝටර් වාහන ප්‍රත්‍යාගණනය 2009.01.01 දින සිට බලපැවැත්වෙන දිනය ලෙස නිශ්චය කරන අතර, පිළිගත් රාජ්‍ය ආයතනයක කාර්මික ඉංජිනේරුවරයෙකුගේ මුලිකත්වයෙන් යුතු ස්වාධීන කොමිසමක් මඟින් කරන ලදී.

13. නිෂ්පාදිත සත්‍ය පැළ හා බෙදා හරින ලද පැළ පදනම් කර ගෙන බද්ධ පැළ සහ බීජ පැළ නිෂ්පාදනයට අදාළ පරිපාලන වියදම් සේවා සහ වාණිජ අංශ අතර, බෙදාහැර ඇත.

ශ්‍රී ලංකා කෘෂි සංස්ථාව

2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

2019.12.31 (රු.)			(රු.)	(රු.)
	වත්කම්	**සටහන්**		
	ජංගම නොවන වත්කම්			
82,027,363.09	දේපළ පිරියත හා උපකරණ	07	77,883,869.75	
34,269,747.25	ඵල දරණ වගා නඩත්තු වියදම්	08	31,135,782.62	
37,862,098.17	ඵල නොදරණ වගා නඩත්තු වියදම්	09	60,329,579.41	
675,024.09	අනෙකුත් කුඩා ව්‍යාපෘති	10	576,524.09	
69,112.00	කෙරීගෙන යන වැඩ-ප්‍රාග්ධන		122,343.00	
154,903,344.60	**මුළු ජංගම නොවන වත්කම්**			170,048,098.87
	ජංගම වත්කම්			
38,263,952.42	තොග	11	64,467,673.60	
21,206,993.81	වෙළඳ ණයගැතියෝ සහ ලැබිය යුතු අනෙකුත් දෑ	12	18,474,967.95	
6,092,927.07	තැන්පතු අත්තිකාරම් හා පූර්ව ගෙවීම්	13	9,828,178.08	
5,201,996.60	මුදල් සහ මුදල් සමාන දෑ	14	42,516,220.25	
70,765,869.90	**මුළු ජංගම වත්කම්**			135,287,039.88
225,669,214.50	**මුළු වත්කම්**			**305,335,138.75**
	ස්කන්ධ සහ වගකීම්			
	ස්කන්ධ			
40,000,000.00	මූලික ප්‍රාග්ධනය		40,000,000.00	
202,788,511.45	රාජ්‍ය ප්‍රදාන		256,381,422.50	
15,766,347.27	අනෙකුත් පාර්ශවයන්ගෙන් ලැබුණු ප්‍රදාන	09	32,337,560.40	
17,441,846.85	ප්‍රාග්ධන සංචිත	10	17,441,846.85	
(141,197,261.12)	ලාභ අලාභ ගිණුම		(149,638,349.05)	
134,799,444.45	**මුළු ස්කන්ධ**			196,522,480.70
	ජංගම නොවන වගකීම්			
35,045,966.00	පාරිතෝෂික දීමනා සඳහා වෙන්කිරීම්		38,953,602.00	
3,500,000.00	දිගුකාලීන ණය	11	3,500,000.00	
38,545,966.00	**මුළු ජංගම නොවන වගකීම්**		42,453,602.00	
	ජංගම වගකීම්			
52,323,804.05	වෙළඳ ණයහිමියෝ සහ ගෙවිය යුතු අනෙකුත් දෑ	12	66,359,056.05	
52,323,804.05	**මුළු ජංගම වගකීම්**			108,812,658.05
225,669,214.50	**මුළු ස්කන්ධ සහ වගකීම්**			**305,335,138.75**

ආර්.ඒ.එස්.කේ.රත්නායක	අශෝකා ලංකාතිලක	කේ.එස්.විජයකීර්ති	එම්.ටී.එස්.කේ.පීරිස්
සභාපතිනි	නියෝජ්‍ය සභාපතිනි	සාමාන්‍යාධිකාරී	සහකාර සාමාන්‍යාධිකාරී -මුදල්

2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට අදාල සටහන්

සටහන් 07

දේපල පිරියත සහ උපකරණ

විස්තරය	පිරිවැය/ ප්‍රත්‍යාගණන අගය 2020.01.01 (රු.)	අදාල වසරේ වත්කම් එකතුවීම්/ ප්‍රත්‍යාගණනය (රු.)	අදාල වසරේ වත්කම් ඉවත්කිරීම්/ විකුණුම් (රු.)	වත්කමේ වර්තමාන පිරිවැය/ ප්‍රත්‍යාගණන වටිනාකම 2020.12.31 (රු.)	2020.01.01 දිනට සමුච්චිත ක්ෂය (රු.)	2020 වර්ෂය සඳහා සමුච්චිත ක්ෂය (රු.)	සම්මුචිත ක්ෂය බැහැර කිරීම හෝ විකුණුම් (රු.)	2020.12.31 දිනට සමුච්චිත ක්ෂය (රු.)	ලියා හරින ලද අගය 2019.12.31 (රු.)
සින්නක්කර ඉඩම්	26,702,824.54	110,000.00	-	26,812,824.54	-	-	-	26,812,824.54	26,702,824.54
ස්ථාවර ගොඩනැගිලි	54,523,229.33	310,377.39	-	54,833,606.72	21,414,919.61	1,564,298.26	22,979,217.87	31,854,388.85	33,108,309.72
අර්ධ ස්ථිර ගොඩනැගිලි	515,811.00	222,820.00	-	738,631.00	463,947.68	37,509.19	501,456.87	237,174.13	51,863.32
වාහන	107,384,607.84	862,450.00	-	108,247,057.84	98,728,839.09	3,225,154.23	101,953,993.32	6,293,064.52	8,655,768.75
යන්ත්‍ර සූත්‍ර	19,743,063.45	466,100.00	-	20,209,163.45	14,009,779.58	1,105,439.24	15,115,218.82	5,093,944.63	5,733,283.87
මෙවලම් හා උපකරණ	9,248,837.32	295,830.00	-	9,544,667.32	8,036,343.08	225,966.27	8,262,309.35	1,282,357.97	1,212,494.24
කාර්යාලීය උපකරණ	12,259,804.09	282,449.00	70,355.00	12,471,898.09	9,810,887.35	471,775.27	10,282,662.62	2,189,235.47	2,378,562.74
ලී බඩු හා සවිකිරීම්	7,894,045.82	328,357.50	-	8,222,403.32	5,273,747.53	269,716.55	5,543,464.08	2,678,939.24	2,620,298.29
නළ ළිං	987,021.18	78,197.00	-	1,065,218.18	664,353.08	66,846.18	731,199.26	334,018.92	322,668.10
වගා ළිං	1,333,680.40	-	-	1,333,680.40	701,215.50	133,368.04	834,583.54	499,096.86	632,464.90
වැව්	608,824.62	-	-	608,824.62	-	-		608,824.62	608,824.62
	241,201,749.59	**2,956,580.89**	**70,355.00**	**244,087,975.48**	**159,104,032.50**	**7,100,073.23**	**166,204,105.73**	**77,883,869.75**	**82,027,363.09**

2019.12.31	2020.12.31 දිනට මුල්‍ය තත්ත්ව ප්‍රකාශයට අදාල සටහන්			2020.12.31
(රු.)	**සටහන් - 08**			(රු.)
	එල දරණ වගාව වියදම්			
32,570,205.58	කජු	සටහන් 08 (අ)		29,651,448.05
1,699,541.67	පොල්	සටහන් 08 (ආ)		1,484,334.57
34,269,747.25			එකතුව	**31,135,782.62**

සටහන් 08 (අ)

එල දරණ වගාව-කජු

2019.12.31	වතුයාය	2020.01.01 දිනට පිරිවැය	2020.12.31 දිනට සමුච්චිත ක්‍රමක්ෂය	2020.12.31 දිනට ශුද්ධ වටිනාකම
(රු.)		(රු.)	(රු.)	(රු.)
1,064,821.51	හාඩ් වතුයාය	3,180,107.38	2,228,598.00	951,509.38
5,278,042.67	කමන්දළුව වතුයාය	18,387,204.86	13,533,417.93	4,853,786.93
5,282,112.49	පුත්තලම වතුයාය	11,089,242.26	6,361,591.88	4,727,650.38
2,274,310.42	එළුවන්කුලම ශා.අභි.මධ්‍යස්ථානය	13,933,185.28	12,355,534.12	1,577,651.16
394,050.10	විලව්විය ශා.අභි.මධ්‍යස්ථානය	655,569.86	294,298.25	361,271.61
3,960,374.44	නාලන්ද ශාක අභි.මධ්‍යස්ථානය	5,963,253.57	2,301,041.81	3,662,211.76
1,246,968.26	මහඔය ශාක අභි. මධ්‍යස්ථානය	1,641,264.30	476,359.26	1,164,905.04
1,731,206.53	මොණරාගල ශාක අභි. මධ්‍යස්ථානය	2,331,959.19	717,350.62	1,614,608.57
1,269,605.30	මාන්කර්ණි වතුයාය	1,410,672.56	211,600.89	1,199,071.67
10,068,713.86	කොණ්ඩව්වි ශාක අභි.මධ්‍යස්ථානය	10,598,646.17	1,059,864.62	9,538,781.55
32,570,205.58	එකතුව	**69,191,105.43**	**39,539,657.38**	**29,651,448.05**

සටහන් - 08 (ආ)

එලදරණ වගාව - පොල්

2019.12.31	වතුයාය	2020.01.01 දිනට පිරිවැය	2020.12.31 දිනට සමුච්චිත ක්ෂය	2020.12.31 දිනට ලියා හරින ලද අගය
(රු.)		(රු.)	(රු.)	(රු.)
940,078.25	හාඩ් වතුයාය	1,650,793.13	793,254.54	857,538.59
748,665.35	කමන්දළුව වතුයාය	2,437,612.22	1,810,817.24	626,794.98
10,798.07	පුත්තලම වතුයාය	431,998.76	431,997.76	1.00
1,699,541.67		**4,520,404.11**	**3,036,069.54**	**1,484,334.57**

සටහන් - 09

2019.12.31	**එල නොදරණ වගාවේ වියදම්**			
(රු.)				(රු.)
34,741,977.54	කජු	සටහන් - 09 (අ)		57,166,748.00
3,120,120.63	පොල්	සටහන් - 09 (ආ)		3,162,831.41
37,862,098.17			එකතුව	**60,329,579.41**

සටහන් - 09 (අ)

එල නොදරණ වගාව - කජු

2019.12.31 දිනට පිරිවැය (රු.)	**වතුයාය**	**2020.12.31 දිනට පිරිවැය (රු.)**
2,130,228.63	භාඩි වතුයාය	2,140,825.58
706,026.95	කමන්දළුව වතුයාය	728,305.32
10,549,669.75	පුත්තලම වතුයාය	13,113,278.10
1,269,855.41	එළුවන්කුලම ශාක අභිජනන මධ්‍යස්ථානය	2,146,847.80
143,601.75	මාන්කර්ණි වතුයාය	935,069.79
329,833.71	මහඔය ශාක අභිජනන මධ්‍යස්ථානය	536,553.71
-	මොණරාගල ශාක අභිජනන මධ්‍යස්ථානය	81,552.00
1,871,964.02	පර්යේෂණ හා සංවර්ධන	2,095,934.95
135,360.40	නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානය	135,360.40
-	පුනරීන් වතුයාය	1,520,190.82
	වෙල්ලන්කුලම් වතුයාය	5,419,570.00
103,822.74	විලච්චිය ශාක අභිජනන මධ්‍යස්ථානය	134,572.74
16,504,322.41	කොණ්ඩච්චි ශාක අභිජනන මධ්‍යස්ථානය	27,160,714.98
997,291.77	තිරියාය ශාක අභිජනන මධ්‍යස්ථානය	1,017,971.81
34,741,977.54	**එකතුව**	**57,166,748.00**

සටහන් - 09 (ආ)

එල නොදරණ වගාව- පොල්

2019.12.31 දිනට පිරිවැය (රු.)	**වතුයාය**	**2020.12.31 දිනට පිරිවැය (රු.)**
1,667,021.57	භාඩි වතුයාය	1,667,021.57
1,453,099.06	කමන්දළුව වතුයාය	1,495,809.84
-	ඔයාමඩුව වතුයාය	-
3,120,120.63		**3,162,831.41**

සටහන් -10

අනෙකුත් කුඩා ව්‍යාපෘති

2019.12.31 දිනට පිරිවැය (රු.)		**2020.12.31 දිනට පිරිවැය (රු.)**
482,874.90	තේක්ක පැළ ව්‍යාපෘතිය	482,874.09
40,000.00	තල	-
90,100.00	දිවුල් ව්‍යාපෘතිය	93,650.00
42,910.00	අතුරු භෝග වගාව -කව්පි	-
19,140.00	අතුරු භෝග වගාව -වට්ටක්කා	-
675,024.90		**576,524.09**

සටහන් -11

ජංගම වත්කම්

2019.12.31 දිනට පිරිවැය (රු.)	**තොග**	**2020.12.31 දිනට පිරිවැය (රු.)**
4,938,493.65	විවිධ	4,179,529.85
-	පොල්	15,677.00
3,801,512.96	කජු මද - අලෙවිසැල්	4,336,211.00
6,616,365.28	- පිරිසැකසුම් මධ්‍යස්ථාන	6,848,525.00
17,929,353.31	ලෙලි කජු	35,062,231.71
4,108,063.50	කජු පැළ	11,794,044.10
870,163.72	ඇසුරුම් ද්‍රව්‍ය	2,231,454.94
38,263,952.42		**64,467,673.60**

2019.12.31 දිනට පිරිවැය (රු.)	සටහන් -12 වෙළඳ ණයගැතියෝ සහ ලැබිය යුතු අනෙකුත් දෑ		2020.12.31 දිනට පිරිවැය (රු.)
5,520,248.22	වෙළඳ ණයගැතියෝ	6,747,974.26	
194,865.00	**අඩු කළා:- බොල්ණය වෙන් කිරීම**	238,203.00	6,509,771.26
5,325,383.22			
17,987,795.01	විවිධ ණයගැතියෝ	14,071,381.11	
(2,106,184.42)	**අඩු කළා:- භානි වීම් වලින් වන අලාභ**	2,106,184.42	11,965,196.69
21,206,993.81			**18,474,967.95**

සටහන් -13
තැන්පතු අත්තිකාරම් සහ පෙර ගෙවුම්

2019.12.31 දිනට පිරිවැය (රු.)		2020.12.31 දිනට පිරිවැය (රු.)
58,535.00	අත්තිකාරම්	931,950.00
-	චේතන අත්තිකාරම්	14,000.00
430,153.72	පෙර ගෙවුම්	4,053,804.88
5,604,238.35	තැන්පතු	4,828,423.20
6,092,927.07		**9,828,178.08**

සටහන් -14
මුදල් හා මුදල් සමාන දෑ

2019.12.31 දිනට පිරිවැය (රු.)				2019.12.31 දිනට පිරිවැය (රු.)
504,139.63	ලංකා බැංකුව - කොල්ලුපිටිය	1633704	(ජංගම)	4,045,074.86
1,871,315.45	ලංකා බැංකුව - කොල්ලුපිටිය	1633705	(ජංගම)	7,937,940.01
317,402.54	ලංකා බැංකුව - කොල්ලුපිටිය	1633710	(ජංගම)	934,372.23
174,875.87	ලංකා බැංකුව - කොල්ලුපිටිය	1633711	(ජංගම)	18,684,370.22
81,123.34	ලංකා බැංකුව - කොල්ලුපිටිය	1649789	(ඉතිරුම්)	7,590,193.41
57,768.15	ලංකා බැංකුව - කොල්ලුපිටිය	1649970	(ඉතිරුම්)	962,145.33
15,593.10	ලංකා බැංකුව - ජා ඇල	813	(ජංගම)	15,593.10
19,250.00	මහජන බැංකුව - නුගේගොඩ	10013	(ජංගම)	7,750.00
4,153.56	මහජන බැංකුව - නුගේගොඩ	20011	(ඉතිරුම්)	4,320.74
226,317.33	මහජන බැංකුව - නුගේගොඩ	20020	(ඉතිරුම්)	245,391.64
28,357.37	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	687	(ඉතිරුම්)	28,357.37
-	මුදල් - අත ඉතිරි (අඹේපුස්ස අලෙවිසැල)			25,630.00
89,210.00	මුදල් - අත ඉතිරි (කොල්ලුපිටිය අලෙවිසැල)			25,160.00
80,200.00	මුදල් - අත ඉතිරි (රාජගිරිය අලෙවිසැල)			101,000.00
10,000.00	සුළු මුදල් අග්‍රිමය			10,000.00
50,000.00	ඉන්ධන අග්‍රිමය			50,000.00
-	මාර්ගස්ථ මුදල්			44,050.00
5,000.00	මුදල් අග්‍රිමය - මුද්දර			5,000.00
70,000.00	කෂ්ප අලෙවිසැල් අග්‍රිමය			207,500.00
195,000.00	මුදල් කිරීම සඳහා ඇති චෙක්පත්			200,000.00
966,232.80	මුදල් - අත ඉතිරි (වාණිජ තවාන්)			703,538.05
21,125.50	මුදල්- අත ඉතිරි (ව්‍යාප්ති)			12,364.59
185,555.00	මුදල් - අත ඉතිරි (පර්යේෂණ හා සංවර්ධන)			241,305.00
309.84	මුදල් - අත ඉතිරි (නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානය)			147,559.65
7,172.00	මුදල් - අත ඉතිරි (පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානය)			322.00
10,832.00	මුදල් - අත ඉතිරි (භාඩි වතුයාය)			65,985.95
44,789.15	මුදල් - අත ඉතිරි (කමන්දළුව වතුයාය)			23,325.85
655.00	මුදල් - අත ඉතිරි (මාන්කර්ණි ශාක අභිජනන මධ්‍යස්ථානය)			706.25
64,254.00	මුදල් - අත ඉතිරි (පුත්තලම වතුයාය)			10,272.00
16,410.23	මුදල් - අත ඉතිරි (එළුවන්කුලම වතුයාය)			133,025.10
-	මුදල් - අත ඉතිරි (මහඔය ශාක අභිජනන මධ්‍යස්ථානය)			975.00
38,375.00	මුදල් - අත ඉතිරි (ඇල්කඩුව ශාක අභිජනන මධ්‍යස්ථානය)			-
0.40	මුදල් - අත ඉතිරි (විලව්විය ශාක අභිජනන මධ්‍යස්ථානය)			100.00
	මුදල් - අත ඉතිරි (වෙල්ලන්කුලම වතුයාය)			23,252.00
200.00	මුදල් - අත ඉතිරි(තිරියාය ශාක අභිජනන මධ්‍යස්ථානය)			211.90
5,406.00	මුදල් - අත ඉතිරි (පුනරින් වතුයාය)			6,396.00
40,973.34	මුදල් - අත ඉතිරි (කොණ්ඩව්ව් වතුයාය)			22,361.00
	මුදල් - අත ඉතිරි (වයින් ව්‍යාපෘතිය)			671.00
5,201,996.60	එකතුව			**42,516,220.25**

සටහන් -15

අනෙකුත් පාර්ශවයන්ගෙන් ලැබුණු ප්‍රදාන

2019.12.31 දිනට පිරිවැය		**2020.12.31 දිනට පිරිවැය**
(රු.)		**(රු.)**
5,901,938.18	උතුරු නැගෙනහිර වෙරළබඩ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය	5,693,188.13
-	අතිරේක වැවිලි භෝග සංවර්ධන අමාත්‍යාංශය	-
9,864,409.09	සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය	9,703,372.27
-	උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැට්, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධන සහ අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	16,941,000.00
15,766,347.27		**32,337,560.40**

සටහන් -16

ප්‍රාග්ධන සංචිත

2019.12.31 දිනට පිරිවැය		**2020.12.31 දිනට පිරිවැය**
(රු.)		**(රු.)**
16,929,116.63	ප්‍රත්‍යාගණන සංචිතය-වාහන	16,929,116.63
512,730.22	අනෙකුත් ප්‍රාග්ධන සංචිත	512,730.22
17,441,846.85	**එකතුව**	**17,441,846.85**

සටහන් -17

දිගු කාලීන ණය

2019.12.31 දිනට පිරිවැය		**2020.12.31 දිනට පිරිවැය**
(රු.)		**(රු.)**
3,500,000.00	වී අලෙවි මණ්ඩලය	
-		3,500,000.00
3,500,000.00	**එකතුව**	**3,500,000.00**

සටහන් -18

ජංගම වගකීම් සහ අනෙකුත් ගෙවියයුතු දෑ

2019.12.31 දිනට පිරිවැය		**2020.12.31 දිනට පිරිවැය**
(රු.)		**(රු.)**
26,189,521.41	විවිධ ණයහිමියෝ	26,219,532.36
18,578,295.03	වෙනත් වියදම්	25,838,129.39
7,555,987.61	උපචිත වියදම්	14,301,394.30
52,323,804.05	**එකතුව**	**66,359,056.05**

ශ්‍රී ලංකා කජු සංස්ථාව

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2019.12.31		**2020.12.31 දිනෙන් අවසන් වර්ෂය**	
(රු)		(රු)	(රු)
	මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
(30,185,250.74)	වර්ෂය තුල ලාභ/අලාභය		(10,885,646.81)
(290,325.00)	පෙර වසර සඳහා ගැලපීම්		2,444,558.88
	මුදල් චලනයන් නොවූ අයිතමයන් සඳහා ගැලපීම්		
12,082,150.32	ක්ෂයවීම්	7,100,073.23	
3,420,039.98	ක්‍රමක්ෂය	3,133,964.63	
8,742,490.00	පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීම	8,321,457.00	
75,995.31	බොල්ණය සඳහා ලියා හැරීම හෝ වෙන් කිරීම	43,338.00	
922,673.86	ස්ථාවර වත්කම් හුවමාරුවෙන් වූ අලාභය	1.00	
-	කෙරීගෙනයන ප්‍රාග්ධන වැඩ	69,112.00	
13,167,618.32	ඵල දරණ වගාව ලියා හැරීම	-	
(97,532.52)	මැරුණු පැළ වලින් වූ අලාභය	-	
(1,989,420.05)	වෙනත් පාර්ශවයන්ගෙන් ලත් ප්‍රදාන	(369,786.87)	
-	අනෙකුත් කුඩා ව්‍යාපෘති ලියා හැරීම	102,050.00	
(110,501.88)	පොලී ආදායම් ලැබීම්	(223,456.36)	
(42,625,753.61)	ප්‍රාග්ධන දීමනා ක්‍රමක්ෂය	(31,057,088.95)	
			(12,880,336.32)
(36,887,816.01)	**කාරක ප්‍රාග්ධනයේ වෙනසට පෙර මෙහෙයුම් ලාභය/අලාභය**		**(21,321,424.25)**
	කාරක ප්‍රාග්ධන වෙනස්වීම්		
(18,041,159.80)	තොගය - (වැඩිවීම)/අඩුවීම	(26,203,721.18)	
(3,799,038.84)	ණය ගැතියෝ - (වැඩිවීම)/අඩුවීම	2,688,687.86	
(3,540,000.54)	අත්තිකාරම් සහ පෙර ගෙවුම් - (වැඩිවීම)/අඩුවීම	(3,735,251.01)	
20,876,408.41	ණය හිමියෝ - වැඩිවීම/(අඩුවීම)	7,289,845.31	
(7,151,174.05)	උපචිත වියදම් - වැඩිවීම/(අඩුවීම)	6,745,406.69	
(11,654,964.82)			(13,215,032.33)
(48,542,780.83)			(34,536,456.58)
(1,400,402.00)	පාරිතෝෂික ගෙවීම්		(4,413,821.00)
(49,943,182.83)	**මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය**		**(38,950,277.58)**
	ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
	ස්ථාවර වත්කම් මිලදී ගැනීම්	(2,956,580.89)	
(2,720,499.97)			
	කෙරීගෙන යන ප්‍රාග්ධන වියදම්		
(69,112.00)		(122,343.00)	
	නව වගාව සඳහා ආයෝජනය කිරීම	(22,467,481.24)	
(10,305,868.21)			
110,501.88	පොලී ආදායම් ලැබීම්	223,456.36	
-	වෙනත් පාර්ශවයන්ගෙන් ලද ප්‍රදාන	16,941,000.00	
(152,150.00)	වෙනත් කුඩා ව්‍යාපෘති සඳහා ආයෝජනය	(3,550.00)	
(13,137,128.30)			(8,385,498.77)
(63,080,311.13)			(47,335,776.35)
	මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
65,057,500.00	රාජ්‍ය ප්‍රදාන		84,650,000.00
1,977,188.87	මුදල් හා මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/අඩුවීම		37,314,223.65
3,224,807.73	වසර ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන දෑ		5,201,996.60
5,201,996.60	වසර අවසානයේ මුදල් හා මුදල් හා සමාන දෑ		**42,516,220.25**

	2020.01.01	**2020.12.31**
	දිනට	දිනට
අත ඇති මුදල්	2,016,661.34	1,901,700.26
බැංකුගත මුදල්	31,625,100.42	2,902,576.59
මාර්ගස්ථ මුදල්	44,050.00	-
ඉතුරුම්		
	8,830,408.49	397,719.75
	42,516,220.25	**5,201,996.60**

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

වෙනස්වීම්	මූලික ප්‍රාග්ධනය (රු)	රාජ්‍ය ප්‍රාග්ධනය (රු)	වෙනත් පාර්ශවයන්ගෙන් ලත් ප්‍රදාන (රු)	ප්‍රාග්ධන සංචිත (රු.)	ලාභාලාභ ගිණුම (රු.)	එකතුව (රු.)
2019.01.01 දිනට ශේෂය	40,000,000.00	175,414,265.06	17,755,767.32	17,441,846.85	(110,011,179.38)	140,600,699.85
පෙර වර්ෂයට අදාල ගැලපුම්	-	-	-	-	(1,000,831.00)	(1,000,831.00)
වර්ෂය තුලදී ලද ප්‍රදාන	-	70,000,000.00	-	-	-	70,000,000.00
ලාභ අලාභ ගිණුමට මාරු කිරීම	-	(42,625,753.61)	(1,989,420.05)	-	-	(44,615,173.66)
මුළු ශුද්ධ ආදායම	-	-	-	-	(30,185,250.74)	(30,185,250.74)
ආදායම ඉක්ම වූ වියදම - සේවා අංශය	-	-	-	-	-	-
2019.12.31 දිනට ශේෂය	**40,000,000.00**	**202,788,511.45**	**15,766,347.27**	**17,441,846.85**	**(141,197,261.12)**	**134,799,444.45**
2020.01.01 දිනට ශේෂය	40,000,000.00	202,788,511.45	15,766,347.27	17,441,846.85	(141,197,261.12)	134,799,444.45
පෙර වර්ෂයට අදාල ගැලපුම්	-	-	-	-	2,444,558.88	2,444,558.88
වර්ෂය තුලදී ලද ප්‍රදාන	-	84,650,000.00	16,941,000.00	-	-	101,591,000.00
ලාභ අලාභ ගිණුමට මාරු කිරීම	-	-	(369,786.87)	-	-	(369,786.87)
මුළු විස්තීරණ ආදායම	-	(31,057,088.95)	-	-	(10,885,646.81)	(41,942,735.76)
2020.12.31 දිනට ශේෂය	**40,000,000.00**	**256,381,422.50**	**32,337,560.40**	**17,441,846.85**	**(149,638,349.05)**	**196,522,480.70**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. ඒආර්අයි/ඩී/එස්එල්සිඔ/එෆ්ජ/2022/01 මගේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 අප්‍රේල් 25 දින

සභාපති
ශ්‍රී ලංකා කපු සංස්ථාව

ශ්‍රී ලංකා කපු සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා කපු සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 හි 38 වන වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල රු.82,027,363ක් වූ දේපළ පිරියත හා උපකරණවල ශුද්ධ අගයට අදාළව සටහන් අංක 07 හි දැක්වෙන තොරතුරු සඳහා සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 02 හි 36 ඡේදය ප්‍රකාරව සංස්ථාව විසින් තොගවලට අදාළව භාවිතා කළ පිරිවැය සූත්‍රයද ඇතුළුව තොග මැනීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12ට අනුව විලම්බිත බදු වටිනාකම (Deferred Tax) මූල්‍ය ප්‍රකාශ තුළ හඳුනාගෙන නොතිබුණි.

අංක 306/72, පොළුදුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 හි 57(c) ඡේදය ප්‍රකාරව, සේවක පාරිතෝෂික වෙන්කිරීම් යටතේ ප්‍රවර්තන සේවා පිරිවැය සහ ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් මත ශුද්ධ පොලිය, ආයුගණක තක්සේරු වාර්තාවෙහි අගයන් මත පදනම්ව විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙන් හඳුනාගත යුතු වුවත් ආයුගණක තක්සේරු වාර්තාව පරිදි සමාලෝචිත වර්ෂයට අදාළ රු.5,512,346ක එම වෙන් කිරීම් සංස්ථාව විසින් සදොස් ලෙස රු.9,678,561ක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට හර කර තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 හි 57(d) ඡේදය ප්‍රකාරව වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගත යුතු ආයුගණක අලාභය (Actuarial Loss) රු.4,068,410ක් ලාභ අලාභ ගිණුමෙහි හඳුනාගෙන ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 හි 139 වැනි වගන්තිය ප්‍රකාරව විශ්‍රාමික පාරිතෝෂික වෙන්කිරීම් විධිමත් ආයෝජන සැලැස්මකට අනුව ආයෝජනය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන දිනට විශ්‍රාමික පාරිතෝෂික වෙන්කිරීම් ගිණුමේ රු.38,953,602 ක ශේෂයට අනුරූපිව කිසිදු ආයෝජනයක් සිදු කර නොතිබුණි.

(උ) මෝටර් රථ 2 ක් සඳහා දරන ලද අලුත්වැඩියා කිරීමේ වියදම් රු. 862,450 ක් මෝටර් රථ ගිණුමට හර කර තිබීම නිසා එම ගනුදෙනුවල ක්ෂය වීම් ගැලපීමෙන් අනතුරුව සමාලෝචිත වර්ෂයේ ලාභය රු.713,556 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී 2019 වර්ෂයේ දී සංස්ථාවේ තිබූ මෝටර් රථ 02ක් අලුත්වැඩියාව සඳහා දරන ලද රු.693,770ක් වූ වියදම් එම වර්ෂයේ දී ප්‍රාග්ධනිත කිරීම නිසා ඒ සඳහා වූ රු.138,754 ක ක්ෂය පිරිවැය ප්‍රමාණයෙන් වර්ෂයේ ලාභය අඩු වී ඇති බව නිරීක්ෂණය විය.

(එ) එවකට පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට රු.9,466,200 ක කඳු පැළ ලබාදී වසර 08ක් ගතවී ඇතත් විවිධ ණයගැතියන් ලෙස ගිණුම්ගතකර ඇති එම ණය ශේෂය අදාළ අමාත්‍යාංශය වර්තමානයේ වසාදමා ඇති හෙයින් අයකර ගැනීම අවිනිශ්චිත අතර එම ණය ශේෂය සඳහා බොල් හා අඩමාන ණය වෙන් කිරීමක් සිදු කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඒ) පසුගිය වර්ෂ 7ක සිට වෙනත් ගෙවිය යුතු වියදම් යටතේ දක්වා ඇති එකතු වටිනාකම රු.3,602,678 ක සහනාධාර ගෙවීම් හා බෝග රක්ෂණ ගෙවීම්, තහවුරු කර ගත හැකි කිසිදු ලිඛිත සහතිකයක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර එම ශේෂයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.2,760,587 ක මුදලක් හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනයේ සමුච්චිත අලාභයෙන් අඩුකර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම් උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

1.3 මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2(අ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	2017 අංක 24 දරන දේශීය ආදායම් පනත	2011 වර්ෂයේ සිට ආදායම් බදු ගෙවීමට හා ආදායම් බදු වාර්තා යැවීමට කටයුතු කර නොතිබුණි. එහෙත් මූල්‍ය ප්‍රකාශවල එම කාලපරිච්ඡේදවලට අදාළව රු.779,483 ක රඳවාගත් බදු (WHT) ලැබිය යුතු ශේෂයක් පෙන්නුම් කර තිබුණි.
(ආ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 18 වගන්තිය	ඉන්වොයිස් පත්‍රයේ සඳහන් දිනයේ සිට දින තිහක් ඇතුළත විගණන ගාස්තු නිරවුල් කළයුතු වුවත් 2005 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළ

විගණන ගාස්තුව රු.2,189,211ක මුදලක් නිරවුල් කර නොතිබුණි.

(ඇ) 2012 ජූලි 24 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණ

සංස්ථාවට නීත්‍යානුකූල අයිතිය නොමැති ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කරන ලෙස පොදු ව්‍යාපාර කාරක සභාව විසින් දැනුම් දී තිබුණද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් ලබා දී ඇති කඳු වගා කරන ඉඩම් අක්කර 11,363 ක නීත්‍යානුකූල අයිතිය සංස්ථාවට පවරා ගැනීමට අදාළ කටයුතු මෙම වාර්තාවේ දිනය දක්වා නිම කර නොතිබුණි.

(ඈ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මු.රෙ. 371(2)(ආ)

කිසියම් විගණිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවක්දී අතුරු අග්‍රිම ලෙස රු.100,000 ක් නිකුත් කළ හැකි බව දන්වා තිබුණද ඊට පටහැනි ලෙස සුළු මුදල් අග්‍රිමය රු.200,000 දක්වා ඉහළ දමා තිබුණි.

(ඉ) 2003 ජුනි 02 දිනැති අංක පිටිඩි/12 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය

ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් වර්ෂ 01 ක මාස 10 ක ප්‍රමාදයකින් පසුව 2023 ජනවාරි 31 දින 2020 වර්ෂයට අදාළ අවසන් ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) සමාලෝචිත වර්ෂයේදී රජයේ මූලධන ප්‍රදාන (Capital Government Grant) ලෙස රු.84,650,000 ක් ලැබී එයින් රු.23,022,359 ක් කඳු හා පොල් වගාවන් යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. එම ප්‍රාග්ධනිත කළ වටිනාකමට ආසන්න ප්‍රමාණයක් වන රු.23,594,880 ක් පුනරාවර්තන වියදම් ලෙස වැයකර තිබුණි. වර්ෂය අවසානයේදී රු.38,032,761 ක මුදලක් ඉතිරිව තිබිය යුතු වුවත් එදිනට ගිණුමේ පැවති ශේෂය රු.4,045,075 ක් විය. ඒ අනුව ප්‍රාග්ධන ප්‍රදාන වලින් රු.33,987,686 ක් වෙනත් කටයුතු සඳහා වැයකර ඇති බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ පුක්තලම හා කමන්දළුව පර්යේෂණ මධ්‍යස්ථාන සඳහා ප්‍රාග්ධන ප්‍රදාන යටතේ රු.4,000,000 ක් වැයකර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ නව පර්යේෂණ කිසිවක් ආරම්භකර නොතිබුණු අතර මධ්‍යස්ථාන දෙකෙහිම පෙර වර්ෂවල සිට ඉදිරියට එමින් පැවති පර්යේෂණ 08 ක් පමණක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

තවද පර්යේෂණවල ප්‍රගතිය ඇහයීම් කළහැකි පරිදි අඛණ්ඩ හා විධිමත් ප්‍රගති වාර්තා නඩත්තු කිරීමක් සිදුකර නොතිබුණි.

(ඇ) පැළ තවාන් කටයුතු සඳහා අවශ්‍ය පොලිතීන් බෑග් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය නිවැරදිව සැලසුම් කර සැපයුම්කරුවන්ට මිල ගණන් ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දී නොතිබීම හේතුවෙන් අදාළ ප්‍රසම්පාදනය සඳහා දෙවරක් මිල ගණන් කැඳවීම කර නිවැරදි සාම්පල් ඉදිරිපත් නොකළ සැපයුම්කරුවන් වෙත රු.2,393,610 ක් වූ ප්‍රසම්පාදනය පිරිනමා තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) කජු අපනයන ගම්මාන ඇති කිරීම ව්‍යාපෘතිය මඟින් බද්ධ කජු පැළ 100,000 ක් නිෂ්පාදනය කර බෙදාහැරීම කර තිබුණි. ඒ සම්බන්ධයෙන් උතුරු පළාතේ හා අනුරාධපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ සිදුකළ අහඹු පැළ සමීක්ෂණයේදී සිටුවා ඇති පැළ ගණනින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියයට 30 ක්ද, වවුනියා දිස්ත්‍රික්කයේ සියයට 34.5 ක් ද, මුලතිව් දිස්ත්‍රික්කයේ සියයට 04 ක්ද හා කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ සියයට 63 ක්ද වශයෙන් පැළ අසාර්ථක වී තිබුණි. සමීක්ෂණයට ලක්කරන ලද සීමිත ප්‍රදේශයන්හි පමණක් පැළ 1,560 ක් අසාර්ථක වී තිබූ අතර එහි වටිනාකම රු.390,000 ක් විය. පැළ සිටුවීමෙදී සාමාන්‍ය අපතය වූ සියයට 6 ක ප්‍රතිශතයන් සැලකිමෙදී එය ඉතා ඉහළ අගයක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

2.3 වෙනත් කරුණු

(අ) සංස්ථාව විකුණුම් කළ කජු ආපසු එවුම් සඳහා මුද්‍රිත බැරපත් (අනුක්‍රමික අංක සහිතව) හෝ ඒ සඳහා වූ ලේඛන පවත්වා නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී එක් ගනුදෙනුකාර ආයතනයක් විසින් සංස්ථාව වෙත එවන ලද රු.1,058,542ක් වටිනා කජු තොගයක් සඳහා බැරපත් ලෙස සඳහන් කර ලිපි දෙකක් නිකුත් කර ඒවා භාරගෙන තිබුණි. විකුණුම් ආපසු එවීම් ආපසු භාරගන්නා කොන්දේසි හා එම ආපසු එවුම් සඳහා හේතු සඳහන් කර නොතිබුණි.

(ආ) වටිනාකම රු.6,747,974ක් වූ ණයගැතියන්ගේ වයස් විශ්ලේෂණ අනුව දින 90 කට වඩා වැඩි කාලයක් සඳහා වූ ණය ශේෂය ලෙස රු. 2,092,275 ක් හා දින 61-90 අතර කාලයට ණය ශේෂය ලෙස රු.485,512 ක ණය ශේෂයන් පැවතියද ඒවා අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) ආසන්නතම පසුගිය වර්ෂ 05 තුළ එනම් 2016 සිට 2020 දක්වා කාලපරිච්ඡේදයේදී රජයේ ප්‍රදාන නොසලකා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල දෘශ්‍ය අලාභය රු.මිලියන 134 සිට රු. මිලියන 102 දක්වා පරාසයක් වී තිබුණි. මේ අනුව කජු සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම අභියෝගාත්මක වී ඇති බව නිරීක්ෂණය විය.

වර්ෂය	අලාභය	රජයේ ප්‍රදාන (ප්‍රතිසංස්කරණය කළ)	රජයේ ප්‍රදාන (මුලික)	ආදායම් ලෙස හඳුනාගත් රජයේ ප්‍රදාන (මුලික)	රජයේ හැර අලාභය
	රු.	රු.	රු.	රු.	රු.
	1	2	3	4	1-2-4
2016	(36,525,411)	48,000,000	40,000,000	31,181,987	(115,707,398)
2017	(42,335,722)	54,000,000	54,000,000	34,025,205	(130,360,927)
2018	(39,642,728)	50,000,000	66,520,000	35,263,122	(124,905,850)
2019	(30,185,251)	60,000,000	70,000,000	44,615,174	(134,800,425)
2020	(10,885,647)	60,000,000	84,650,000	31,426,876	(102,312,533)

(ඇ) ලෙලි කපු, කපු මද හා කපු පැළ ඒකක පිරිවැය ගණනය කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබීම නිසා එකතු වටිනාකම රු.58,041,012 ක් වූ අවසන් තොග වටිනාකම ගණනය කළ ආකාරය විගණනයේදී පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ඉ) වසර 07 ක් ඉක්මවූ වූ වී අලෙවි මණ්ඩලයට ගෙවිය යුතු රු.3,500,000 ක ණය මුදල සහ ඊට අදාළ පොලිය රු.927,500 ක් සමාලෝචිත වර්ෂයේ දී ගෙවීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

12. විගණන වාර්තාවේ සඳහන් අඩුපාඩු නිවැරදි කර ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග

ශ්‍රී ලංකා කපු සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව නිකුත්කර ඇති විගණකාධිපති වාර්තාවේ අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් සංස්ථා පාර්ශවයෙන් අදහස් දැක්වීම්.

1.2 (අ) මෙහි සඳහන් දේපළ, පිරියත හා උපකරණවලට අදාළ ශුද්ධ අගය/ධාරණ අගය සම්බන්ධයෙන් වන සංසන්දනාත්මක තොරතුරු සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරන අතර, මින් ඉදිරියට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කිරීම් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකර කටයුතු කරනු ලැබේ.

1.2 (ආ) තොග මැනීමට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හා භාවිතා කරන ලද පිරිවැය සූත්‍රය (පෙර ලැබීම් පෙර නිකුතු ක්‍රමය - FIFO Method) සම්බන්ධයෙන් අදාළ වන තොරතුරු සටහනක් මගින් මුල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

1.2 (ඇ) විලම්බිත බදු හා සම්බන්ධ ගැලපීම් ගිණුම් පොත්වලට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

1.2 (ඈ) සමාලෝචිත වර්ෂයට අදාළව ලබාගත් ආයුගණක තක්සේරු වාර්තාවට අනුව නිවැරදිව අදාළ ගැලපීම් සිදුකරමින් 2020.12.31 දිනට රු. 38,953,702/-ක පාරිතෝෂික වෙන්කිරීම් ශේෂය මුල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත.

1.2 (ඉ) මෙම විගණන විමසුමේ සඳහන් කරුණු හේතුකොටගෙන නිරූපන දෝෂයක් (Presentation Error) පමණක් සිදුවී ඇති අතර, සංස්ථාවේ සමස්ත ශුද්ධ වත්කම් කෙරෙහි මෙමඟින් බලපෑමක් සිදුවී නොමැත.

1.2 (ඊ) මේ වනවිට පිළියෙල කර ඇති 2022 වර්ෂයට අදාළ සංස්ථාවේ මුල්‍ය ප්‍රකාශනවලට අනුව 2022.12.31 දිනට පවතින පාරිතෝෂික වෙන්කිරීම් අගයට අනුරූපව ඒ සඳහා සිදු කළ යුතු ආයෝජනය රු. 3,578,916/-ක් වන අතර, සංස්ථාවේ පවතින දැඩි මුල්‍ය දුෂ්කරතා හේතුකොටගෙන දැනට අදාළ ආයෝජනයන් සිදුකර නොමැත. කෙසේ

නමුත් සංස්ථාවේ මුල්‍ය තත්ත්වය යහපත් වනතුරු, පාරිතෝෂික වෙන්කිරීම් සඳහා මසකට රු.100,000/-ක් බැගින් වන සේ ආයෝජනයක් සිදුකිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් පිළියෙල කර ඉදිරිපත් කර ඇති අතර, ඒ අනුව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත.

1.2 (උ) මෙහි සඳහන් මෝටර් රථ අළුත්වැඩියාව සඳහා වැයවී ඇති රු. 862,450/- ක වියදම් සිදුකර ඇත්තේ අදාළ මෝටර් රථවල එංජින් අළුත්වැඩියාවන් (Engine Repairs) සඳහා වන අතර, මෙම අලුත්වැඩියාවන් හේතුකොටගෙන අදාළ මෝටර් රථවල ඵලදායී ජීවිත කාලය සැලකිය යුතු වර්ෂ ගණනකින් ඉහළ ගොස් ඇති බැවින්, අදාළ වියදම් මෙසේ ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇත.

1.2 (ඌ) 2019 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන මත ඉදිරිපත් කරන ලද කෙටුම්පත් විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු ඉදිරිපත් කළ ආකාරයට මෙහි සඳහන් රු. 693,770/- ක මෝටර් රථ අලුත්වැඩියා වියදම ප්‍රාග්ධනිත කිරීම සිදු කරන ලද්දේ එම වියදම් අදාළ මෝටර් රථවල සම්පූර්ණ එංජින් අලුත්වැඩියාවන් (Overhauled Complete Engine Repairs) සඳහා වැය කර ඇති බැවින්, ඒ අනුව මෙහි සඳහන් පරිදි රු. 138,754/- ක අගයකින් ලාභයේ අඩුවීමක් සිදුවී නොමැත.

1.2 (එ) මෙහි සඳහන් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් මෙම සංස්ථාව වෙත ලැබිය යුතු රු. 9,466,200/-ක ණය වටිනාකම අයකරවා ගැනීම සඳහා දැඩි උත්සාහයක් ගනු ලැබූ නමුත් එය අසාර්ථක වී ඇත. දැනට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය නමින් රජයේ අමාත්‍යාංශයක් නොමැති අතර, ඒ අනුව අදාළ ණයගැති ශේෂය සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කළ යුතු ආකාරය පිළිබඳව නිසි උපදෙස් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ.

1.2 (ඒ) මෙහි සඳහන් රු. 3,602,678/- ක ගෙවිය යුතු සහනාධාර හා භෝග වගා රක්ෂණ වියදම් සම්බන්ධයෙන් 2022.12.29 වන දින පැවති සංස්ථා විගණන කමිටුවේදී සාකච්ඡා කරන ලද අතර, අදාළ වගකීම් සම්බන්ධව වර්තමාන බැඳියාවක් මෙම සංස්ථාවට නොමැති බැවින්, එම අගයන් ගිණුම් පොත්වලින් කපා හැරීම සඳහා විගණන කමිටුව මගින් නිර්දේශ කරන ලදී. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්ව ගිණුම් පොත්වල මේ සම්බන්ධව අවශ්‍ය ගැලපීම් සිදු කරන ලද අතර, මේ වනවිට එම විගණන කමිටු නිර්දේශය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

2.2.2. (අ) මේ සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග සාකච්ඡා කරන ලදුව මෙහි සඳහන් පසුගිය ගිණුම් කාලසීමාවන්ට අදාළව සංස්ථාවේ ආදායම් බදු තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය ආදායම් බදු වාර්තා එම දෙපාර්තමේන්තුව මඟින් ලබා ගැනීමට කටයුතු කර ඇති අතර, ඒ අනුව එම ආදායම් බදු වාර්තා නිසි පරිදි සම්පූර්ණ කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යැවීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

2.2.2 (ආ) මෙහි සඳහන් 2020.12.31 දිනට ජාතික විගණන කාර්යාලය වෙත ගෙවිය යුතුව පවතින රු. 2,189,211/-ක විගණන ගාස්තු වලින් මේ වනවිට රු. 528,006/-ක මුදලක් ගෙවා ඇති අතර, මුදල් ප්‍රතිපාදන ලැබෙන ආකාරය අනුව ඉතිරි ගෙවිය යුතු විගණන ගාස්තු ද කඩිනමින් ගෙවා නිමකිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.2 (ඇ) මේ යටතේ දැනට අයිතිය පවරාගෙන නොමැති පහත සඳහන් ඉඩම් සංස්ථාව මඟින් පරිහරණය කරනු ලබයි.

අනු අංකය	වතුයාය / බීජ උද්‍යානය	අයිතිය	දිස්ත්‍රික්කය	ප්‍රා.ලේ. කොට්ඨාසය	ප්‍රමාණය අක්කර
01.	එළුවන්කුලම අදියර I	රජය සතු	පුත්තලම	වනාතවිල්ලුව	210
02.	එළුවන්කුලම අදියර I	රජය සතු	පුත්තලම	වනාතවිල්ලුව	406
03.	ආච්චිගෙවත්ත	ඉඩම් ප්‍රති.කොා.ස.	පුත්තලම	වනාතවිල්ලුව	961
04.	කමන්දළුව	ඉඩම් ප්‍රති.කොා.ස.	පුත්තලම	රස්නායකපුර	548
05.	හාඩි	ඉඩම් ප්‍රති.කොා.ස.	මඩකළපුව	වාලච්චේන	365
06.	පුනරීන්	රජය සතු	කිළිනොච්චිය	පුනරීන්	479
07.	කොණ්ඩච්චි	රජය සතු	මන්නාරම	මුසලි	6,498
08.	තිරියාය	රජය සතු	ත්‍රිකුණාමලය	ගෝමරන්කඩවල	35
09.	මාන්කර්ණි	රජය සතු	මඩකළපුව	කෝරලේපත්තුව උතුර	1,075
10.	විලච්චිය	වන සංර.දෙපා.	අනුරාධපුරය	මහවිලච්චිය	25
11.	සුදුවතුර ආර	වන සංර.දෙපා.	මොණරාගල	මොණරාගල	45
12.	මහඔය	වන සංර.දෙපා.	අම්පාර	මහඔය	81
13.	නාලන්ද	ඇල්කඩුව වැවිලි සමාගම	මාතලේ	මාතලේ	135
14.	වෙල්ලන්කුලම	රජය සතු	මන්නාරම	බටහිර මාන්තායි	500
එකතුව (අක්කර)					**11,363**

ඉහත ලේඛනයේ අනු අංක 01 හි සඳහන් අක්කර 210 ක භූමි ප්‍රමාණයකින් යුක්ත එළුවන්කුලම අදියර I ඉඩම දීර්ඝකාලීන බදු පදනම යටතේ මෙම සංස්ථාව වෙත

පැවරීමට අවශ්‍ය සියළු කටයුතු මේ වනවිට සම්පූර්ණ කරවාගෙන ඇති අතර, ඒ අනුව වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ඊට අදාළ වාර මුදල් හා බදු මුදල් ගෙවන ලෙස මෙම සංස්ථාව වෙත දැනුම් දී ඇති අතර, එම කටයුතු නිමවූ වහාම එම ඉඩමේ හුක්තිය සහිත බදු ඔප්පුව මෙම සංස්ථාව වෙත හිමිවේ.

එසේම ඉහත අනු අංක 2,6,7,8,9 හා 14 යටතේ දක්වා ඇති එළුවන්කුලම අදියර II. පුනරීන්, කොණ්ඩච්චි, තිරියාය, මාන්කර්නි හා වෙල්ලන්කුලම යන වතුයායන් හා බීජ උද්‍යානවල, එකතුව අක්කර 8,993ක් වන ඉඩම්වල අයිතිය දීර්ඝකාලීන බදු පදනම යටතේ ශ්‍රී ලංකා කජු සංස්ථාව වෙත පවරා දීමට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය හිමිවී ඇත. ඒ අනුව එම ඉඩම් පිහිටි ප්‍රදේශවල ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ එක්ව අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරගෙන යනු ලැබේ.

එමෙන්ම මෙහි අනු අංක 3, 4 හා 5 යටතේ දක්වා ඇති ආච්විගේවත්ත, කමන්දළුව හා හාඩි යන වතුයායන් හි එකතුව අක්කර 1,874ක ඉඩම් කොටස් සංස්ථාව වෙත පවරා ගැනීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නිලධාරීන් සමඟ අවශ්‍ය මූලික සාකච්ඡා පවත්වා ඇති අතර, ඒ අනුව ඉදිරි කටයුතු සිදුකරගෙන යනු ලැබේ.

අනෙක් ඉඩම්වල අයිතිය මෙම සංස්ථාව පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින අතර, ඒ සඳහා අනුගමනය කළයුතු ක්‍රියාවලිය ඉතා දීර්ඝ වන බැවින්, සැලකිය යුතු කාලසීමාවක් ගතවේ.

2.2.2 (ඈ) බැංකු වේලාවන්ගෙන් බැහැරව එදිනෙදා හදිසි අවශ්‍යතාවයන් සඳහා වියදම් දැරීමේදී, සංස්ථාවේ වියදම්වල ස්වභාවයට අනුව, ප්‍රායෝගික තත්ත්වයන් යටතේ ඒ සඳහා ප්‍රමාණවත් වන සේ මෙහි සඳහන් පරිදි රු. 200,000/- ක අග්‍රිම මුදලක් පවත්වා ගෙන යනු ලැබේ.

2.2.2 (ඉ) ශ්‍රී ලංකා කජු සංස්ථාව සඳහා 2019 වර්ෂය තෙක් අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය වූයේ සංස්ථාවේ එක් එක් පිරිවැය මධ්‍යස්ථාන සඳහා වෙන වෙනම ශේෂ පිරික්සුම් සකස් කර, එමගින් එක් එක් පිරිවැය මධ්‍යස්ථාන සඳහා වෙන වෙනම අවසාන ගිණුම් පිළියෙල කොට අවසානයේ ඒවා ඒකාබද්ධ කිරීමයි. එමඟින් සංස්ථාවේ වාණිජ හා සේවා අංශයන් හි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වෙන් වෙන් වශයෙන් අවසාන ගිණුම් පිළියෙල වූ බැවින්, එම අංශ සඳහා තීරණ ගැනීමේ කටයුතු ද විධිමත්ව සිදුකිරීමේ හැකියාව පැවතිණි.

2019 වර්ෂය සඳහා ඉහත ක්‍රමවේදයම අනුගමනය කරමින් අවසාන ගිණුම් නියමිත කාල සීමාව තුළදී සම්පූර්ණ කර, විගණන කටයුතු සඳහා ජාතික විගණන කාර්යාලය වෙත ඉදිරිපත් කළ අතර, එම කාර්යාලයේ නිලධාරීන් විසින් අදාළ ගිණුම් විගණනය කර කෙටුම්පත් විගණකාධිපති වාර්තාවක් ද සංස්ථාව වෙත යොමු කරන ලදී.

ඉහත කෙටුම්පත් විගණකාධිපති වාර්තාව සඳහා සංස්ථාව මගින් පිළිතුරු ඉදිරිපත් කළ අතර, එහිදී පිරිවැය මධ්‍යස්ථාන සඳහා එක් එක් ශේෂ පිරික්සුම් වෙනුවට සමස්ථ සංස්ථාව සඳහාම එක් ශේෂ පිරික්සුමක් සකස් කර, එමගින් අවසාන ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කරන ලෙසට එම නිලධාරීන් විසින් උපදෙස් ලබා දෙන ලදී. කෙසේ නමුත් දීර්ඝ කාලයක් තිස්සේ භාවිතා කරන ලද හා ඒ වනතුරු විගණන විමසුම් ඉදිරිපත් වී නොමැති ගිණුම්කරණ ක්‍රමවේදයෙන් බැහැරව ඉහත පරිදි එක් ශේෂ පිරික්සුමක් පිළියෙල කිරීම අපහසු වූ හෙයින් 2019 වර්ෂය සඳහා විගණකාධිපති උපදෙස් මත අවසාන ගිණුම් සම්පූර්ණ කිරීමට නොහැකි වූ අතර, ඒ අනුව පැරණි අවසන් ගිණුම් කට්ටලය ඉවත්කර ගැනීමට මෙම සංස්ථාවට සිදුවිය.

පසුව නව ක්‍රමවේදය අනුගමනය කරමින් 2019 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලද අතර, ඒ සඳහා සැලකිය යුතු කාලසීමාවක් ගතවිය. මෙම කාල ප්‍රමාදය හේතුකොටගෙන 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීමේදී ද ප්‍රමාදයක් සිදුවිය.

කෙසේ නමුත් මේ වනවිට 2021 හා 2022 යන වර්ෂයන් සඳහා ද මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර, 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ විගණන කටයුතු සඳහා ජාතික විගණන කාර්යාලය වෙත භාරදී ඇත. එසේම 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා මේ වනවිට යොමු කර ඇති අතර, එම අනුමැතිය ලද වහාම අදාළ මූල්‍ය ප්‍රකාශන විගණන කටයුතු සඳහා ජාතික විගණන කාර්යාලය වෙත යැවීමට කටයුතු කරනු ලැබේ.

2.2.4 (අ) මෙහි සඳහන් පරිදි රු. 23,594,880/-ක වැය කිරීම් පුනරාවර්තන වියදම් ලෙස හඳුනාගෙන ඇතත්, එහි ඇතුළත්ව ඇත්තේ සංස්ථාවේ කඵු වගා ව්‍යාප්ති කටයුතු හා පර්යේෂණ කටයුතු සඳහා ප්‍රාග්ධන වියදම් යටතේ වෙන්කරනු ලබන ප්‍රතිපාදනවලින් සිදුකර ඇති වියදමයි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී ලද ප්‍රාග්ධන ප්‍රදාන වැය කර ඇති

ආකාරය පිළිබඳ සියළු තොරතුරු ඇතුළත් සැසඳීම් ලේඛනයක් ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

2.2.4 (ආ) 2020 වර්ෂය තුළදී සංස්ථාවේ පුත්තලම හා කමන්දළුව පර්යේෂණ මධ්‍යස්ථාන මඟින් නව පර්යේෂණ කිසිවක් ආරම්භ කර නොමැති බවට මෙම විගණන විමසුමේ සඳහන්ව පැවතිය ද සමාලෝචිත වර්ෂය තුළදී පහත සඳහන් නව පර්යේෂණ වැඩසටහන් එම මධ්‍යස්ථාන මගින් ක්‍රියාත්මක කර ඇත.

1. කජු වගාවේ සුළු හා ප්‍රධාන පලිබෝධ කළමනාකරණය.

2. අගය එකතුකිරීමේ නිෂ්පාදනයක් ලෙස කජු පුහුලන් විජලනය.

3. ශ්‍රී ලංකාවේ කජු වගා කටයුතු සිදු කරන ප්‍රදේශ අනුව කජු වගාවට බලපාන දේශගුණික විපර්යාස හා ඒවායේ බලපෑම.

4. කජු ගසේ කඳ සහ මුල් විදින පලිබෝධකයන් සම්බන්ධ ඒකාබද්ධ පාලනය. ඉහත සඳහන් නව පර්යේෂණ වැඩසටහන්වලට අතිරේකව 2020 වර්ෂය තුළදී WUCC 02, WUCC 16 හා WUCC 07 යන උසස් තත්ත්වයේ වැඩිදියුණු කළ නව කජු ප්‍රභේද 03ක් කජු කර්මාන්තයේ අදාළ ප්‍රතිලාභීන් වෙත හඳුන්වා දීම ද සිදු කරන ලදී.

එසේම සංස්ථාවේ පර්යේෂණ අංශය මඟින් සිදුකරනු ලබන පර්යේෂණ වැඩසටහන්වල ප්‍රගතිය සම්බන්ධයෙන් මාසිකව ප්‍රධාන කාර්යාල පර්යේෂණ අංශය මඟින් ප්‍රගති වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන අතර, මීට අතිරේකව ත්‍රෛමාසිකව වයඹ විශ්ව විද්‍යාලයේ වැවිලි කළමනාකරණ පීඨයේ මහාචාර්යවරයෙකුගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලබන සංස්ථාවේ පර්යේෂණ හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී ද අදාළ පර්යේෂණ කටයුතුවල ප්‍රගතිය සම්බන්ධයෙන් හා ඒවායෙහි සිදුවිය යුතු සංශෝධනයන් හා යාවත්කාලීන කිරීම් පිළිබඳව කරුණු සාකච්ඡා කරනු ලැබේ. අදාළ සාකච්ඡා සටහන් ද අවශ්‍ය නිර්දේශ-සමඟ අධ්‍යක්ෂ මණ්ඩලයේ පරිශීලනය පිණිස ඉදිරිපත් කරනු ලැබේ.

2.2.4 (ඇ) මෙහි සඳහන් පරිදි 2020 වර්ෂයේ සංස්ථාවේ කජු පැළ තවාන්වලට අවශ්‍ය පොලිතින් බෑග් මිලට ගැනීම සඳහා මුද්‍රා තැබූ මිලගණන් ලංසු කැඳවූ අතර, අදාළ කාලවකවානුව

තුළදී දිවයින පුරා සීඝ්‍රයෙන් පැතිර ගිය කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් රාජකාරි කටයුතු දැඩි ලෙස සීමාවීම මත වාණිජ තවාන් කටයුතු සඳහා පැවති ඉදිරි කාලය සැලකිල්ලට ගෙන මිල ලංසු ඉදිරිපත් කිරීම සඳහා සීමිත වූ දින ගණනක් ලබාදෙන ලදී. එම පළමු අවශ්තාවේදි මිල ලංසු කැඳවීමේදී ලැබී තිබුණේ එක් මිල ලංසුවක් පමණක් වූ අතර, ඒ අනුව විධිමත් පරිදි මිල සංසන්දනයක් සිදුකිරීම සඳහා නැවත වරක් සීමිත දින ගණනක් පමණක් ලබාදී මිල ලංසු කැඳවන ලදි. එම දෙවන අවස්ථාවේදී මිල ලංසු 06ක් ලැබී තිබූ අතර, අදාළ ලංසුකරුවන් ඔවුන්ගේ මිල ලංසු සමඟ ඔවුන් සපයන පොලිතින් බෑග්වල නියැදි එවා තිබුණි.

එම මිල ලංසු හා පොලිති බෑග් නියැදි, තාක්ෂණික ඇගයීම් කමිටුවකට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව විධිමත් පරිදි ලංසුකරුවෙකු තෝරාගෙන තිබුණු අතර, ඒ අනුව නිවැරදි නියැදි ඉදිරිපත් නොකළ ලංසුකරුවන් වෙත ප්‍රසම්පාදනය පිරිනමා ඇති බවට මෙහි සඳහන් කරුණු දැක්වීම නිවැරදි නොවේ.

2.2.4 (ඇ) 2020 වර්ෂයට අදාළව කජු අපනයන ගම්මාන නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික්ක 05ක ප්‍රතිලාභීන්/ගොවීන් 774 දෙනෙකු වෙත බෙදාහරින ලද කජු පැළ 100,000/-ක ප්‍රමාණයට අදාළව ප්‍රතිලාභීන් විසින් වගා කරන ලද මුළු අක්කර ප්‍රමාණය 1,428.63ක් වන අතර, අදාළ දිස්ත්‍රික්කවලට අනුව එහි විශ්ලේෂණය පහත පරිදි වේ.

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	වගා අක්කර ප්‍රමාණය	බෙදාහරින ලද කජු පැළ ප්‍රමාණය
01.	අනුරාධපුරය	251	357.13	25,000
02.	වව්නියාව	238	357.00	25,000
03.	පුත්තලම	180	428.50	30,000
04.	මුලතිව්	78	143.00	10,000
05.	කිළිනොච්චිය	27	143.00	10,000
එකතුව		**774**	**1,428.63**	**100,000**

පැවති කාලය හා සම්පත්වලට අනුව සංස්ථාවේ ව්‍යාප්ති අංශය මඟින් ඉහත දිස්ත්‍රික්ක 05න් 04ක අහඹු ලෙස පරීක්ෂා කර ඇති වගා අක්කර 53.58ක මුළු ප්‍රමාණය, අදාළ දිස්ත්‍රික්ක 04හි බෙදාහරින ලද කජු පැළවලින් වගා කරන ලද

අක්කර 1,000.13ක මුළු ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් වශයෙන් ගත් කළ 5.36%ක ඉතා සුළු ප්‍රතිශතයකින් යුක්ත වන අතර, එහි විශ්ලේෂණය පහත දැක්වේ.

අනු අංකය	දිස්ත්‍රික්කය	මුළු වගාව අක්කර ප්‍රමාණය	ව්‍යාප්ති අංශය මගින් අහඹු ලෙස පරීක්ෂා කරන ලද වගා අක්කර ප්‍රමාණය	මුළු අක්කර ගණනට සාපේක්ෂව පරීක්ෂා කළ අක්කර ප්‍රමාණයෙහි ප්‍රතිශතය (%)
01.	අනුරාධපුරය	357.13	12.00	3.36
02.	වව්නියාව	357.00	17.50	4.90
03.	මුලතිව්	143.00	19.00	13.28
04.	කිළිනොච්චිය	143.00	5.08	3.56
එකතුව		**1,000.13**	**53.58**	**5.36**

ඉහත සඳහන් 5.36%ක වගා පරීක්ෂණ නියැදි ප්‍රතිශතය සැලකිල්ලට ගැනීමේදී එම නියැදි පරීක්ෂාව මගින් ලබාගත හැක්කේ වගාවේ සාර්ථකත්වය සම්බන්ධයෙන් වන දළ අදහසක් පමණක් වන හෙයින් එම නියැදි පරීක්ෂාවේ ප්‍රතිඵලය සමස්ත වගා අක්කර ගණනට ආදේශ කිරීම ප්‍රායෝගික නොවේ.

කෙසේ නමුත් මෙම කජු වගාවන් සිදුකර ඇත්තේ වියළි කාලගුණයක් සහිත ප්‍රදේශවල බැවින්, අධික නියහය හේතුකොටගෙන ක්ෂේත්‍රයේ කජු පැළ යම් ප්‍රමාණයක් මිය යාමේ සම්භාවිතාවයක් පවතින අතර, වන සතුන්ගෙන් වන හානි ද ඒ සඳහා තවදුරටත් බලපෑ හැකිය.

2.3 (අ) 2023.04.30 දින තෙක් සියළුම කජු මද ආපසු එවුම් ගනුදෙනු සඳහා විධිමත් පරිදි බැරපත් යෙදීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති අතර, ඊට අදාළ අභ්‍යන්තර පාලන ක්‍රියාවලියේ අවශ්‍ය සංශෝධන සිදුකිරීම සම්බන්ධයෙන් ද ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.

2.3 (ආ) මෙහි සඳහන් කල්පසු වී ඇති එකතුව රු. 2,577,787/-ක් වන ණයගැති ශේෂයෙන් මේ වනවිට රු. 1,103,377/-ක මුදලක් අයකරවා ගැනීමට කටයුතු කර ඇති අතර, ඉතිරි

රු. 1,474,410/-ක ණයගැති ශේෂය ද කඩිනමින් අයකරවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

2.3 (ඇ) සංස්ථාවේ සේවා ක්‍රියාකාරකම් ලෙස ක්‍රියාත්මක වන ව්‍යාප්ති හා පර්යේෂණ සහ සංවර්ධන සේවා සඳහා වෙනමම ආදායම් හා වියදම් ගිණුමක් පිළියෙල නොකරන අතර, එම පිරිවැය මධ්‍යස්ථානයන් හි පිරිවැය ද සංස්ථාවේ වාණිජ ක්‍රියාකාරකම්වලට අදාළ ලාභ මධ්‍යස්ථානවල පිරිවැය සමඟ ඒකාබද්ධ කර ගිණුම්ගත කිරීම සිදුකරනු ලබයි.

සංස්ථාවේ සේවා ක්‍රියාකාරකම්වලට අදාළ පිරිවැය ඉහත පරිදි ගිණුම්ගත කරනු ලැබුවද එම සේවා සැපයීම් මඟින් පොදුවේ හිමිවන ප්‍රතිලාභ ගිණුම්ගත කිරීමක් සිදුනොවන හෙයින් එම තත්ත්වය සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇති අතර, ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන්ගේ ද අවශ්‍ය උපදෙස් ලබා ගනිමින් සේවා ක්‍රියාකාරකම් හි ප්‍රතිලාභ අස්පෘශ්‍ය වත්කම් ඇසුරින් ගිණුම් පොත්වලට සම්බන්ධ කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරගෙන යනු ලැබේ. එසේම සංස්ථාවේ විකුණුම් තවදුරටත් ඉහළ නංවා ගනිමින් හා වියදම් කළමනාකරණය කර ගනිමින් ලාභදායිත්වය වර්ධනය කර ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු කර ඇති අතර, ඒ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

2.3 (ඈ) ලෙලිකපු හා කපු පැළ සම්බන්ධ පිරිවැය ගණනය කිරීම සඳහා පවතින ක්‍රමවේදයේ ගැටළු සහගත තත්ත්වයක් නොමැති අතර, සංස්ථාවේ කපු මද නිෂ්පාදන වර්ග රාශියක් පවතින බැවින්, එක් එක් කපු මද නිෂ්පාදනය සඳහා වෙන් වෙන් වශයෙන් පිරිවැය ගණනය කිරීම සංකීර්ණ ක්‍රියාවලියකි. කෙසේ නමුත් මෙම විගණන ඡේදයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර ඇති අතර, ඒ අනුව කපු මදවල නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම වෙනුවෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා විශේෂඥ දැනුම සහිත කමිටුවක් සුදුසු පරිදි පත්කර දෙන ලෙසට විෂය භාර අමාත්‍යාංශයෙන් ලිඛිත ඉල්ලීමක් සිදුකර ඇත. මේ අනුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරනු ඇත.

2.3 (ඉ) සංස්ථාවේ පවතින මූල්‍ය දුෂ්කරතා හේතුකොටගෙන මෙම වී අලෙවි මණ්ඩලයට ගෙවිය යුතු රු. 3,500,000/-ක ණය ගෙවීම් ප්‍රමාද වී ඇති අතර, මූල්‍ය තත්ත්වය යහපත් වූ පසු කොටස් වශයෙන් හෝ මෙම ණය ගෙවීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

13. ශ්‍රී ලංකා කඳු සංස්ථාව

වසර 05 ක ගිණුම් සාරාංශය **රු.(000)**

	2020	2019	2018	2017	2016
ලාභ ලාභ ගිණුම	**Rs.**	**Rs.**	**Rs.**	**Rs.**	**Rs.**
ශුද්ධ විකුණුම්	109,120	100,082	94,931	100,951	94,906
විකුණුම් පිරිවැය	(72,190)	(67,857)	(61,023)	(80,182)	(68,648)
දළ ලාභය	**36,930**	**32,225**	**33,908**	**20,769**	**26,258**
අනෙකුත් ආදායම්	43,300	48,343	10,544	15,522	28,224
පුනරාවර්තන ප්‍රදාන	60,000	60,000	15,077	18,700	16,923
පරිපාලන වියදම් / අනෙකුත් වියදම්	(147,982)	(167,334)	(38,407)	(38,893)	(39,141)
ක්‍රමක්ෂය	(3,134)	(3,420)	539	244	(634)
වාණිජ කටයුතු වලින් ලත් ශුද්ධ ලාභය	**(10,886)**	**(30,186)**	**21,661**	**16,342**	**31,630**
සේවා අංශය - ආදායම් ඉක්ම වූ වියදම්	-	-	**(61,303)**	**(58,678)**	**(68,155)**
ශුද්ධ අලාභය	**(10,886)**	**(30,186)**	**(39,642)**	**(42,336)**	**(36,525)**
ශේෂ පත්‍රය					
ජංගම නොවන වත්කම්					
දේපල, පිරියත සහ උපකරණ	77,883	82,027	87,369	89,363	100,869
ඵල දරණ වගා නඩත්තුව	31,135	34,270	27,436	22,870	29,303
ඵල නොදරණ වගා නඩත්තුව	60,329	37,862	51,591	50,446	41,362
කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ	576	69	-	1,726	-
අනෙකුත් කුඩා ව්‍යාපෘති	122	675	523	620	949
මුළු ජංගම නොවන වත්කම්	**170,045**	**154,903**	**166,919**	**165,025**	**172,483**
ජංගම වත්කම්					
තොග	64,467	38,264	20,222	24,940	28,916
වෙළඳ ණයගැතියෝ සහ ලැබිය යුතු අනෙකුත් දෑ	18,474	21,207	17,484	19,597	20,798
අත්තිකාරම් සහ පූර්ව ගෙවීම්	9,828	6,093	2,553	3,810	4,841
මුදල් හා මුදල් සමාන දෑ	42,516	5,202	3,225	5,806	7,874
මුළු ජංගම වත්කම්	**135,285**	**70,766**	**43,484**	**54,153**	**62,429**
මුළු වත්කම්	**305,330**	**225,669**	**210,403**	**219,178**	**234,912**
හිමිකම් සහ වගකීම්					
හිමිකම්					
මූලික ප්‍රාග්ධනය	40,000	40,000	40,000	40,000	40,000
රාජ්‍ය ප්‍රදාන	256,381	202,788	175,414	143,996	123,860
අනෙකුත් පාර්ශවයන්ගෙන් ලැබුණු ප්‍රදාන	32,337	15,766	17,756	18,143	18,530
ප්‍රාග්ධන සංචිත	17,441	17,442	17,442	17,442	17,442
ලාභාලාභ ගිණුම	(149,638)	(141,197)	(110,011)	(70,311)	(27,975)
මුළු හිමිකම්	**196,521**	**134,799**	**140,601**	**149,270**	**171,857**
ජංගම නොවන වගකීම්					
පාරිතෝෂික දීමනා සඳහා වෙන්කිරීම්	38,953	35,046	27,704	27,335	40,060
දිගුකාලීන ණය	3,500	3,500	3,500	3,500	-
මුළු ජංගම නොවන වගකීම්	**42,453**	**38,546**	**31,204**	**30,835**	**40,060**
ජංගම වගකීම්					
වෙළඳ ණයහිමියෝ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	66,359	52,324	38,598	39,073	22,995
මුළු ජංගම වගකීම්	**66,359**	**52,324**	**38,598**	**39,073**	**22,995**
මුළු ස්කන්ධ සහ වගකීම්	**305,333**	**225,669**	**210,403**	**219,178**	**234,912**
ශුද්ධ වත්කම් ප්‍රතිලාභය %	(5.5)	(22.4)	(28.2)	(28.3)	(21.3)
ශුද්ධ ලාභ අනුපාතය %	(10.0)	(30.2)	(41.8)	(41.9)	(38.5)
ජංගම අනුපාතය	2.0	1.4	1.1	1.4	2.7
ක්ෂණික වත්කම් අනුපාතය	1.1	0.4	0.6	0.7	1.5
මුළු ආදායමට මුළු වියදම	(1.0)	(0.9)	(0.8)	(0.8)	(0.1)